# දහම් ගැට

Prof. Vini Vitharana's
Book Collection
Donated by his Family.

සංස්කාරක
ගන්දර පි. ඩී. ඇස්. වීරසූරිය

ගුණසේන

2503

# දහම් ගැට

0139

# ශුද්ධි පත්‍රය

| පිටුව | පේළ | වරද | නිවරද |
|---|---|---|---|
| 25 | 30 | පංඤ්චවිධ | පඤ්චවිධ |
| 31 | 18 | කය | කාය |
| 40 | 8 | නිග්‍රෝධ මිග ජාතකයේ යන තැනට වුවමනා අධෝ ලිපිය ඌනය. එය මෙසේ විය යුතු. | 12 වැනි ජාතකය ජාතක පොත 36 පි: |
| 47 | 10 | වැ මවති. | වැඩමවති. |
| 48 | 13 | (අධෝ ලිපිය) යදිනට | යදියතට |
| 53 | | (අධෝ ලිපිය) වෙති | වැනි |
| 54 | | අධෝ ලිපිය – අගට මෙසේ එක් වියයුතු. | ජාතක පොත 160 පි: |

## මේ සංස්කාරකයාණන්ගේ
## වෙනත් කෘති කිහිපයක්

මාතර සාහිත්‍ය වංශය

දෙවුන්දර ඉතිහාසය

වර්ණනා සහිත හංස සන්දේශය

,, ,, නීල කොබෝ සන්දේශය

බාරස කාව්‍යය

ගුත්තිල කාව්‍ය දීපනිය

## කියවීම් පොත්

සිංහල කවීන්ද්‍රයෝ ( 2-5 ප්‍ර: )

සරල කථා ( ඉ. බා-5 ප්‍ර: )

# දහම් ගැට

සංස්කාරක

ගන්දර පී. ඩී. ඇස්. වීරසූරිය



කොළඹ

සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම
217, ඔලිවර් වීදිය, කොළඹ.
33, යටිනුවර වීදිය, මහනුවර

ප්‍රථම මුද්‍රණය – ජූලි 1958

කොළඹ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම විසින්
මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

# සංක්ෂිප්තය

විවේක කාලය විනොදාස්වාදයෙන් ගතකිරීමට කවුරුත් කැමැතියහ. සමහරු පංච කෙළිය, දුත් ඇදීම, කඩදාසි කෙළිය ඊට උපයෝගී කරගනිති. තවත් සමහරෙක් තූර්‍ය භාණ්ඩ සහිතව හෝ රහිතව සංගීතයෙහි යෙදෙති. ඇතැමෙක් සිංදු සීපද කියති. නැටුම් ගැයුම් විහිළු තහළු රිස්සෝ එසේ කරති. බණකතා, ගැමිකතා, ගැමි කවි සමහරු අගය කරති. අනෙක් කෙනෙක් ප්‍රහෙලිකා – තේරවිලි ආදිය රිසි වෙත්.

අම්බලමක රැස්වූ අය විනෝද කාලය ගතකළ අයුරු

"අවා මහ අවරණ
සිදුකරන සැප අපම ණ
ඉගෙන ගෙන එළු බණ
කියති සමහරු බුදුන්ගේ ගුණ

සමහරු උදාරා
උනුහට වෙමින් වාරා
බසින් බස සාරා
කියති සිත් කාම පද තෝරා

වෙත වෙත ම පැසී
කියමින් උනුන් වාසී
සමහරු සිනාසී
කියති සිවුපද දෙපද රාසී" යි

මේ ඈ විසින් ගිරා සන්දේශයෙහි පෙනේ.

ආගමානුකූල පද්‍ය – දහම් ගැට ආදිය කියමින් තෝරමින් සමහරු ප්‍රීත වෙති.

**ප්‍රහෙලිකා**

දහම් ගැට ප්‍රහෙලිකා ගණයට අයත් ය. ප්‍රහෙලිකා නුවණ වැඩීමට හා සොම්නසට හිත බව ලපටි පෙළෙහි වූ කුමර කුමරියන් ගේ - පොඩිත්තන්ගේ පැතපොඩි වලින්ද ඔප්පු වේ.

"එතවා එතවා බදන්න බැහැ? (සුළඟ)
"අලිය තො කත දල්ල" (ගිනිදල්ල)
"තැට්ට තැති කොළේ" (කඩදාසි කොළේ)
"අත්තක් උඩ බුම්මාගෙන කටු රෙද්දක් පොරවා ගෙන" (කොස්ගෙඩිය)
"අගුරු කකා වතුර බිබී කොළඹ දුවන යකඩ යකා" (දුම්රිය - වාෂ්පී රථය)
"ගියාම ආපසු තේන්නේ කුමක් ද? (තරුණකම)
"ආවාම තැවත තොයන්නේ කුමක් ද? (මහලුකම)

මේ අැ සුරතල් තේරවිලි ගැන සිතිකරමු.

තේරවිලි යයි කියනු ලබන මෙවැනි දෑ පිළිබඳ ප්‍රශ්න කවියෙන් කීමත් ඊට කවියෙන් ම පිළිතුරු දීමත් විනොදාත්මක ක්‍රීඩාවෙකි.

**තේරවිලි පැනය:-**

| | | |
|---|---|---|
| ටං ටං ගාන්නා | තෝරා | එවන්නේ |
| ටිං ටිං ගාන්නා | තෝරා | එවන්නේ |
| මහ වැලි පිසින්නා | තෝරා | එවන්නේ |
| දෙගං බඩ රජා | තෝරා | එවන්නේ |

**පිළිතුර**

| | | |
|---|---|---|
| ටං ටං ගාන්නේ | ගෝනා | නොවේදෝ |
| ටිං ටිං ගාන්නේ | ලේනා | නොවේදෝ |
| මහ වැලි පිසින්නේ | කුකුළා | නොවේදෝ |
| දෙගං බඩ රජා | කිඹුලා | නොවේදෝ |

තේරවිලි පෑනය:-

ඇඟ ත් කොළත් දෙවගේ එකවගේ වෙතී
තුඩ ත් පල ත් දෙවගේ එකවගේ වෙතී
ප දත් මුලු ත් දෙව ග් එකවගේ වෙතී
උ ගත් තැතැත් තෝ තෝරාලා කියතී

පිළිතුර

ඇ ඟ ත් උ ගේ තුග කොළ දෙක එක වාගේ
තු ඩ ත් උ ගේ ඉදි. තුග පල එක වාගේ
මූලු ත් තු ගේ ගිරවගෙ පා එක වාගේ
කිවෙ ත් තු ගේ සිටි ගිරවකු දෑක වාගේ

තේරවිලි පෑනය:-

ගසට නමකි ගස මළ කල වෙත නමකි
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නමකි
මදට නමකි මද කත කොට වෙත නමකි
මෙතුන් පදේ තෝරාලා කියත් සකී

පිළිතුර

ගසට "ගොසම්" ගස මළ කල 'පිදුරු" ගස
පලට "වී" පලය සුඹුලට කියත බස
සාලැට වසා සිටි "කුඩු - දහයියා" රුස
මදට "හාල්" නම් එය බුදින "බත්" රුස

තේරවිලි පෑනය:-

ගසෙන් වැටිලා ඝතරට පැළිලා ඔහෙ එක මිනිහෙක් ගෙයි
කාශ ලොවින් ආ කළු වැදි සාමී බොටුව කඩාගෙන ගෙයි
ගින්නෙන් දලා වැස්සට තෙමිලා තව එක මිනිහෙක් ගෙයි
මෙකි මෙ තුන් දෙන සමගි කරන්නට මැරිච්ච මිනිහා කොයි

**පිළිතුර**

රබ්බඩ පුවකෝ දෙකට පළාලා හතරට ඉරු කර තෙයි–
තෙ තෙයි තෙයි – හතරට ඉරුකර තෙයි
වෙත්තිල බුලතෝ තැට්ට කඩාලා සූතම්බු ගාතෙයි – තෙ
තෙයි තෙයි – සූතම්බු ගාතෙයි

දීකොට තැත්දට මස්සක් දීලා දුම්කොළ ඉල්ලා තෙයි –
තෙ තෙයි තෙයි – දුම්කොළ ඉල්ලා තෙයි
පිත්තල පොත්තක් දතමුල ගහගෙන පහතට දත නියතෙයි–
තෙ තෙයි තෙයි – පහතට දත නියතෙයි

**තේරවිලි පැනය:–**

සෙක්කු විලස මොල්ලිය ඉස දරාගෙන
තප්පු ලලා දෙවෙලෙහි කුරුව ඇවිදින
ඔප්පු නැතුව යුද දිනු කටු වලින් ඇත
වෙප්පු තාල්ලත ගොත් තෝරනු මෙ දැන

**පිළිතුර**

සෙක්කු විලස මොල්ලිය ඉස කරමලකී
තප්පු ලලා දෙවෙලෙහි හඩලන බබකී
ඔප්පු නැතිව යුද දිනු පොරකටු දෙහකී
වෙප්පු තාල්ලත ගොත් කුකුලෝය ඡකී

**තේරවිලි පැනය:–**

පාදෙක ඇත දුර ගමනක් බෑ හේමා
නෙත් දෙක ඇත කිසි බැල්මක් නෑ හේමා
කුස පණ නැත කුසගිනි නැතුවා හේමා
මෙ පද අරුත තෝරන්නට බෑ හේමා

**පිළිතුර**

වතත්තරේ ගල් උණුවෙනවා හේමා
ගමේ කම්මලේ මිටියේ වැඩ හේමා
ගහේ බොර දියෙන් පණ රැකුණා හේමා
මෙ තුන් පදේ ගිරේට කීවා හේමා

**තේරවිලි පෑනය:-**

මාරයාගෙ කු ල සකි නුඹ දත්තව ද
මාරයාගෙ පෙ ල සකි නුඹ දත්තව ද
මාරයාගෙ තො ල සකි නුඹ දත්තව ද
මාරයාගෙ වි ල සකි නුඹ දත්තව ද

**පිළිතුර**

මාර කු ල නොවෙයි සකිසඳ කුර මල
මාර පෙ ල නොවෙයි සකිසඳ පේර මල
මාර තො ල නොවෙයි සකිසඳ තෝර මල
මා ර වි ල නොවෙයි සකිසඳ වීර මල

**තේරවිලි පෑනය:-**

සත් සමුදුරේ දියපල්ලේ උපන්නේ
එම සමුදුරේ දිය මතු පිට පෙනෙන්නේ
වැස්සට පිනි බබා නිතරම මෝරන්නේ
අද බැරි නම් හෙට තෝරා එවන්නේ

**පිළිතුර**

සත් සමුදුරේ දියපල්ලේ තිබෙයි අල
එම සමුදුරේ දිය මතු පිට තිබෙයි කොල
වැස්සට පිනි බබා මෝරන කැකුළ මල
මස්ටකයින්ට මුතුකුඩයකි නෙලුම් මල

**තේරවිලි පෑනය:-**

දූර දෙකයි එක තම මුල්කර තැනුවා
පාර තිහක් තැළුවට බයකුත් නැතුවා
කණු සතරයි කොන් සතරයි ගෙට තැනුවා
තෝරාපන් ඊයේ මඟදී දුටුවා

**පිළිතුර-** ඉබ්බා

**තේරවිලි පැනය:-**

සව්සරා උයන් පොකුණේ උපන්නේ
ගව් ගණන් ගොසින් මහතුන් දකින්නේ
තැව් පුරා රුවල් සුළඟට වැනෙන්නේ
මවු මරා උපන් කුමරා කියන්නේ

**පිළිතුර-** කෙසෙල් (කැන) මල

**බෙත් පිළිබඳ තේරවිලි**

විනෝද කාමී පැරැන්නෝ බෙත් පිළිබඳව ද ප්‍රහෙලිකා කාව්‍ය ගෙතූහ. බැලූ කෙණෙහි විහිළු තහළු සේ පෙනෙතත් අවුස්සා බැලූවිට එහි අදහස යස රඟට පැහැදිලි වේ.

**ශුක්‍ර දුහයට කසායක්**

සිකුරාදා කැලේ මුත්තා යනවාට
රදවා පාරෙ ගිනි මොලවන්න එනවට
එගිනි නිවන්නට ගිනි වතුරත් බොන්ට
දුගිය වැලේ යුස දීපන්න හනිකට

මූත්‍ර සමඟ ශුක්‍ර මොවනය වනවිට රුදා උෂ්ණ ගති ඇති වේ. ඒ ගින්න නිවීමට දුගිය වැල් කසාය උණු කර පමා නොකර දෙන්න. බිම් පොහොට - බිම් පුහුල්- පඩ වැල් යන නම් වලින් හැඳින් වන දුගිය වැල් කසාය කර දීම ශුක්‍ර දුහයට හිත බවය මේ කීවේ.

**උණට කසායක්.**

කුට1 මත2 නාගරා3 අඹු4සොඳ කට කාරී5
අට අඹු ගොනා සිටි අඹු එකකුට බෙරී6
සිට අඹු කතා ලුණු ලා7 පස් දින නැරී8
අට වන ජොරා9 බැට කා ගෙන යයි බෙරී10

අඹුවන් අට දෙනකුගේ සැමියා ව ජොරාට දූන් සිටින බිරිය කට කාරියක. ඇසක් කණ වූ ඇ පස් දිනක දී ලුණු දමුවොත් ඇගෙන් ගුටි කා යන්තම් බේරී යා හැක - යනු ගැගෙන සේ මෙසේ විහිළුවක් කළේ උණට කසායක් තියම කිරීමේ දීය.

1කොත්තන්, 2රසකිඳ, 3ඉඟුරු, 4කලාඳුරු, 5කටුවැල් බටු සම සමව ගෙන 6වතුර අට පත එකට සිඳුවා 7සෙනඹව ලුණු ප්‍රතිවාප කර බීමෙන් 8දින පහෙන් මෙ පිට 9අෂට වර්ගයෙහි වූ ජ්වරයන් (උණ) 10සත්සිඳෙන බවයි මෙසේ රහස් ලෙස කීවේ.

බඩේ රූජාවට

1 යක් ඇස් දෙකක් 2 ලොකු බෙතීන් එකක් ගෙන
3 එනු හැලි 4 වේද ගණනට කිරා ගෙන
5 අඹු අට දෙනෙක් එකකුට දීලා රගෙන
බිව් කල බඩ රූජා ගුල්මය වේය ගුන

පිළිතුර

1 කු ඹු රු ඇටද 2 ඉඟුරු 3 සුදුඑනු ද රගෙන
4 ඇ ඳු රු පිළිවෙලින් කිරමින් තියම දූන
5 ව තු ර අට එකට සිඳුවා දුන්නොතින
රූ ජු රු බඩ රිදුම ගුල්මය යායෙ පැන

බේත් දෙකක්

ක ස ව ද ලුණු පැන් සමගිව බුත්තා
කු ස ර ද හැර පබවත සුපස න්තා
අ ස මෝ ද මදුරද ගහණන දුන්නා
පි ය සෙ ද සක් රද හල මිණි මෙන්නා

පිළිතුරු

කුසරජ හා පබාවතිය හා පිළිබඳ පෙම් පුවත එළිපිට පෙනෙන සේ රචිත මෙහි බේත් දෙකකි. i වදකහ ලුණු දියර සමඟ දීමෙන් බඩේ රූජාව දුරු වේ. ii අසමොදගත් මී පැණි යෙන් නස්‍ය කළ විට ඇස් රූජාව සුවවේ.

**ප්‍රසූත රුජාව වැඩි දියුණු කිරීමට කසායක්**

ම දු ත් ම දු ත් හරත් මදුත්
ව ද ත් ව ද ත් නිමල් මිදත්
මෙද ත් බෙහෙත් ගෙනත් යොදත්
ව ද ත් ව ද ත් වහා වදත්

**පිළිතුර**

වැල් මී, එළ ඔලිඳ, මී අරටු, වදකහ, අති උඩයන්, සහ කොට්ටන් කසාය කර දෙන්න.

**විනෝදාත්මක කෙළි කවි**

ස්ත්‍රියක හා ඇගේ සැමියා රෑ ගෙයි සිටිය දී ඇගේ හොර සැමියා පැමිණි බව දන්වන රිසින් ගේ තුළට වැලි මිටක් දැමූයෙන් සර සර ගා වැටුණේය. සිය සැමියා ගෙය තුළ බව දන්වනු වස් ඈ කවියක් කීවාය. කිහිප වරක්ම එය කියමින් දරුවා නැලෙව්වාය. එයට කිපුණු සැමියා "නිට සොර සැමියෙක් ඉන්නවා ද? මේ කීම උඹට සත් කිරීමක් නොවේ ද"යි අසමින් තරවටු කළේය. ගෙර වුම් පිප්පුම් පෑවේය. "සමාවන්න, ඔබට මා කී දේ නො තේරුනාට මම් කුමක් කරම් ද? මේ මා සාදූ කිවුවක් නො වේ. බිලිකටුවක ඇමට අමුණාපු පණුවෙක් තමා ගිලින්නට ආ මාලුවකුට කියූ නියායෙන් පැවැත එන කවියෙකි. නිදිමත වතතුරු වෙතදත් සිවුපද කියන මා දරු පැටියා නළවමින් කිහිප වරක් කියූ මෙහි අදහස මෙන්න" "මාගේ ඇඟ ඇතුළේ බිලි කටුවකි. උඹ කුමට ද සර සර ගා එන්නේ? උඹ මා (ඇම) ගිල්ලොත් උඹත් මාත් දෙන්නා ම නසිනවා ඇත. නුඹ පලයන්. එවිට දෙදෙනා ම නො නැසී රැකේ." මෙසේ විසඳීමෙ ස්ත්‍රී මායමට මෝඩ පුරුෂයා ගොදුරු විය. මෙන්න ඒ කවිය.

යකඩ මාතා ගෙයි සිටින්නේ
සර සර ගා නුඹ කුමටද එන්නේ
උඹත් තැසීලා මාත් තසින්නේ
දෙන්නම නො නසා නුඹ පලයන්නේ

බැදිගම නායක හිමියන් බණ දෙසුමකට වැඩ පුරුදු පරිදි ගිලට බත් වැළඳීමට නො ලැබ ආපසු වැඩම කළ බව දැනගත් හිතවතාණ කෙනෙක් මේ කවිය එවූහ.

බයන කිස නො රිසි මැතිඳුගෙ අයදුම ට
දෙන බසුන් පිණිස වැඩ කෝදගොඩ ට
බත කතක් නැතිව උදයේ වැළඳුම ට
තිණ පයන් වැඩිය කදිමයි මාතර ට

කළු අකුරු පද ආපිට පෙරළා නැවත කවිය කියමින් රස විඳින්න.

මොණරතරත් කුළිවැකුලත් කලක වෙතේ
හාමිරකෙක් වට කොලිගෙත් ඉඩ මසිතේ
ගොටළුබැනෙක් මා රතයෙන් දුත පැවතේ
වූකි නතත් ගොල තසියා නොත තකතේ

මේ මුළු කවිය ම පෙරළි බසින් ලියන ලද්දකි. ( i පාදය ) "රණ මොතරත් වැලිකුකුළත් වෙලක කතේ" යනුවෙන් පේරළා බලන්න. අනෙක් පද ද එසේ පෙරළා නැවත කවිය කියන්න මහත් ම විනෝදයක් ගෙන දේ.

*මුල පෙරළි

පොල් වත්තේ නැද්ද අඹ දඹ ආදි පල
වල් පොත්තේ ඉඩමෙ නම් තිබුණා සියල

රාළහාමිගේ බාලට යමිය කියා
බාලහාමිගේ රාළත් ඔන්න ගියා

---

* ගෞ. ඩී. සී. පී. කරුණාරත්න දෙවිගැතිඳුගේ ප්‍රබන්ධයකිනි.

කල්දෙන්නට සතුටු නැති අපෙ මහත්මයා
දෙල් කන්නට දෙතොත් බොහොමත් සමත්මයා

පාරුවෙ පුවක් පටවා ගෙන යන කලට
පූරුවෙ පවක් පල දුණි පෙරළී ගඟට

*අග පෙරළි

මි ලී ඇසූ කල අම්මා මන්ද නිදි
ලි ලී පැවසුවා උන්දෑට නින්ද මදි

ප වූ ල් වනසත්ට දුක දී මරාසූන
රූ කු ල් දෙන දෙයක් නැත යුරු සූරාමන

දු ටු දුටු තැන ඇතත් පුත්තලමෙ මූංවතු
ඇ සු දුටු තැනක බේනට නොමැත වංමූතු

ඇ තත් අවි හතික බැරි කපනු ගල්කණු
ම හ ත් දෙය කරනු හැකි පමණ කල්ගණු

ඇ හු ව කල කොහි ද වත්තල පිංගෙඩිය
සු හු ව කෙනෙක් දුනි පිත්තල වංගෙඩිය

බල්ලා රුදුරු මත හුත් නැග පිදුරුගොඩ
ඉල්ලා වත් නොදුනි ගොනුනට ගොදුරුකිඩ

හොඳින් යා නො හැකි මිනිහෙක් කකුල් කඳ
බ ල න් අර අරත් යන හැටි කුකුල්කඳ

ප්‍රහෙලිකා පද්‍ය

දූත උගත්කම් අනුව ගුප්තාර්ථ දක්වනු වස් ගෙතුණු ප්‍රහෙලිකා කාව්‍ය ද ඇත.

මාතර සාහිත්‍යයට පිවිසුණු උසස් ම ප්‍රහෙලිකා රචනායකි බාරස කාව්‍යය නම් වූ බුද්ධාභිවාදන දුෂ්කර බන්ධනය. එය ලියන ලද්දේ කරතොට කිර්ති ශ්‍රී ධර්මාරාම පාන රට මහා නායක හිමියන් විසිනි.

---

* ගෞ. ඩී. සී. පී. කරුණාරත්න දෙවිගැහිදුගේ ප්‍රබන්ධයකිනි.

පෙ ර රැ ස  තගා පලහා අන්තිම  රාසී
තො ම රැ ස  එක් ගහන් දස එක්වත  රාසී
යු ග රැ ස  වන් දතෝ එකතුව කර  පැසී
ප ස රැ ස  ලෙසින් විකුමෙන් බස් දෙත  වාසී*

බක්මස මුදුනේ සැතපී ඉඳලා
මඳක් තැගී බැලූ කල  ඉවතා
නවම් මසක් සුරතට අරගතිමින්
බිතරේ යතවා දැක  දිමූතා
වෙසක් මසට තිසි එකකු ඇවිල්ලා
බිතරේ අල්ලා ගෙත  දුවතා
අසත්න වියතුති අම්බල ගම දී
ජොසොත් මසෙක් යෙදිතැයි  කියතා*

මේ නකත් සතර අනුව හරණ ගණිතාවාසීසන් විසින් ලියන ලද ප්‍රහෙලිකා ගණයේ උපහාසාත්මක පැදි දෙකකි.

කේරවිලි කවියක්

සි ය ප ත්  සියසෙ ගිම දෙයි කිරණ  කොඳ සිය
තියකෙත්  සතුර දද බැඳ යුදට  සැර සිය
ශි දූ හ ක්  ඛනඛා පිළිකුල් නමැති  දිගැසිය
අ ද ව ත්  ම වෙත තා දුක නො හැක  ඉවසිය

සිදුහත් නම් - අබ, කතක නම් - රත්, පිළිකුල් නම් - චී; "අබරත් චී" යන සත්‍රී නාමය යි මේ කීවේ. මෙය පත් තායමේ ලේකම ගේ පබැඳුමකැ යි විශ්වාස කරත්.

තුන් කේරවිලි

උ රතු ර  රං ජ  තේ වෙත්කත  තිරතුරුම
සුර පුර  මෙ ත් ද තේ කෙත් වත්  ඇති අරුම
වැරසැර  වි ත් ද තේ රුපු මැති  කිතල ගම
සුර පුර  වැං ජ  තේ තේවත  කරුණ කිම

---

* වර්ණනා සහිත තිලකොබෝ සන්දේශය (සංස්කරණය xvi - xviii පිටු) බැලීමෙන් විස්තර දත හැක.

පිළිතුර: සුර පුර තම් සගේ, වැංජතේ තම් මාලුව,
සගේ මාලුව - මගේ සාලුව.

පැනය

හා ද කම් දුරට පවතා සක් සේ මා
වා ද වි මෙ මට දෙනු කිම දුක් බෝ මා
බේ ද තො ව මෙ කව මුල් ගණ සතරේ මා
යෝද කතේ අතෙ මට දෙන්. පෙර'කුරු මා

පිළිතුර- හාදුපසක් [සිඹීම් (=චුම්බන) පහක්]

පැනය

ලකුණු මම කියම් යත්තම් දැනගත්බ
දුකුලු තව මාස ගණනක් පසුවෙන්බ
මිල දීලාවත් දැන් මෙහි තැන ගත්බ
මුල සිවුකුර ඇර ළග සිවු කුර ගත්බ

පිළිතුර- කුකුළල

පැනය

කුරු සතරින් තෙ කුරට ගනු ඉස්පිල්ල
වග පසයෙන් සිවුදිග ළග කුර එල්ල
මට කිහයෙන් ඉඳිතෙම් දෙවියන්- පල්ල
මෙතොප ගොසින් අපගේ යති ගෙන් ඉල්ල

පිළිතුර- ලිත

සංස්කෘත ප්‍රහෙලිකා

වනෙ ජාතො වනෙත්‍යක්තා - වනෙ තිෂ්ඨති නිත්‍යශඃ
පණ්‍ය ස්ත්‍රීන් තු සා වෙශ්‍යා - යොජනාති සපණ්ඩිතඃ

(වනයෙහි උපන්නීය. ජලයෙහි හරන ලද්දීය. නිතර ජලයෙහි සිටියි. ඇ මුදල් ආදිය දිමෙන් ප්‍රයෝජන ගත හැකි වුවත් වෙසගනක් නො වෙයි. පිළිතුර - ඔරුව හෝ නෞකාව)

තරුණ්‍යා ලිංගිතඃ කණ්ඨෙ නිතම්බ සථල මාශ්‍රිතඃ
ගුරූණාං සන්නිධානෙ'පි කඃ කූජති මුහුර්මුහුඃ

(තරුණාංගනාව විසින් ගෙලෙහි වැලඳගන්නා ලදුව උකුල (කටි) පෙදෙස ඇසුරු කළාවූ කවරෙක් ගුරූන් ඉදිරිපිටත් ශබ්ද පතුරුවත් ද? අඬත් ද? පිළිතුර – දිය සහිත කළය)

වෘක්ෂා'ග්‍ර වාසී නච පක්ෂි රාජස්
ත්‍රිනෙත්‍ර ධාරී නච ශූල පාණිඃ
ත්වග් වස්ත්‍ර ධාරී නච සිද්ධ යොගී
ජලංච බිභ්‍රත් න ඝටො න මෙඝඃ

(ගස මුදුනෙහි වසනත් පක්ෂි රාජයෙක් නො වේ. ඇස් තුනක් ඇතත් ඊශ්වරයාත් නො වේ. පොතු නැමැති වස්ත්‍ර දරතත් තවුසකුත් නො වේ. දිය ඇතත් කළයකුත් නො වේ. මෙඝයකුත් නො වේ. පිළිතුර – පොල්ගෙඩිය)

විදග්ධ මුඛ මණ්ඩනය සංස්කෘත ප්‍රහෙලිකා ද ද්‍රුෂ්කර බන්ධනාදිය කාව්‍යාදර්ශය ද සවිස්තරව දක්වා ඇත.

පාළි

ප්‍රහෙලිකාත්මක පාළි භාෂාමය ගාථා ද ඇත.

මාතරං පිතරං හන්ත්වා
රාජානො ද්වෙච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා
අනීඝො යාති බ්‍රාහමණො

(මවු ද පියා ද ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද නසා එසේ ම අය කැමියා සහිත රට ද නසා ඒ බමුණු තෙමේ නිදුක්ව නිවන් පුර වදනේය.)

මේ මෙහි එළි පිට පෙනෙන අදහස ය. නියම අදහස මෙසේ දතයුතු. මාතරං – (තෘෂ්ණා නැමැති) මව ද, පිතරං– (මානය නැමැති) පියා ද, ද්වෙච ඛත්තියෙ – (ශාස්වත–

උවේජ්ද දැමටි නැමැති) ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද, හන්ත්වා තසා, සානුචරං - (නන්ද රාග නැමැති) අයකැමියා සහිත වූ, රට්ඨං - (ද්වාදශායතන නැමැති) රට ද, හන්ත්වා - අඝීත් මාගී ඥත නැමැති කඩුවෙන්) නසා, බ්‍රාහමණො - (ක්ෂීණා- ශ්‍රව නැමැති) බ්‍රාහමණ තෙමේ, අනීඝො යාති - නිදුක්ව (නිවන් පුර) පිවිසෙන්නේ ය.

(ධම්මපද - පකිණ්ණක වග්ග-5)

සුබොධාලංකාරයෙහි ප්‍රහෙලිකා ප්‍රභෙද සොළොස් ගණයක් දක්වූහ. ඉන් ප්‍රහෙලිකා දෙකක් හා පිළිතුරු ද මෙහි ඇත. සවිස්තරව ඒ පොතෙන් බලාගත හැක.

ධාවන්තං උදයා හන්ඵං
මුහුත්තං න නිවත්තති
න චන්ද මණ්ඩලං එතං
තාපි ආදිච්ච මණ්ඩලං

උදය කාලයෙහි පටන් අසනංගත වන තුරු ඇසිල්- ලෙකුත් නො නැවති දුවන්නේය. ඒ සඳ මඩලක් නො වේ. හිරු මඩලක් නො වේ. කිමෙක? පිළිසිඳීමේ පටන් චුතිය (මරණය) තෙක් නො කඩවා ගමන් කරන මෙය ආයුෂය බව දතයුතු.

චතුද්දිසා මුඛා බද්ධා
චත්තාරො සින්ධවා සයං
පරිභුඤ්ජන්ති නිකඛිත්තං
තිණං මජ්ඣේ යථා සුඛං

අශ්වයෝ සතර දෙනෙක් පෙර අපර ආදී සිවු දිගට මුහුණු ලා බඳනා ලද්දාහු මැද ලූ තණ සුවසේ තුමූ ම අනු- භව කරති.

ඔවුනොවුනට පිටුපා බැන්ද සේ වැටහෙන බැවින් නො සිදුවිය යුත්තක් - එනම් තණ බුදීම නො කළ හැකි බවක් හැඟේ. සිවු දිගට මුහුණු සිටුනා සේ බැඳි බැවින් තණ කෑ බව සැබැවි.

## දහම් ගැට

ආගමානුකූල අදහස් ගැටළු ලෙස ගෙතුණු දහම් කවි "දහම් ගැට" නම් තේරුම් ගත නොහැකි කීමක් ගැටළුවක් ඇසූ දුටු තැන ගම්බද මහල්ලෝ, "මොනව කියනව ද? ඔය දහම් ගැට අපි දන්නේ නැහැ"යි අදත් පවසති. ගී යුගයේ ක්‍රීඩාවක් ලෙස ගැනෙන ප්‍රහේලිකා විශේෂයක් යයි කිව යුතු දහම් ගැට කියවන විට සිනහ නො වී නො සිටිය හැක. සිනහ සිසී මේවා කියවනුයේ එයින් එළිපිත්තු වන අදහසක් නො දැනෙන හෙයින් කෙළි කවටකම් මෙන් සිතා ගෙන ය. සිංහලයෙහි පර්යාය වචන බහුල වීම හා බණ දහම් මනා සේ දැනුම හා රටේ පරිසරය ගැන විසාරද දැනුමක් ඇති බව දහම් ගැට වැනි ගැටළු පැදි ලිවීමට මං සැලසුණු බව නො රහසෙකි. භාරා - රස අවුස්සා - විශ්වවිද්‍යාත්මකව බලන විට ආගමය මියර නො ඉක්ම වූ ගැඹුරු දහම් නය දහම් කතා මෙහි ගැබ් වී ඇති බව උගතුනට අවබෝධ වේ. දහම් ගැට කුමන අදහසක් පිණිස ගොතන ලද දැ යි දහම් ගැට ලිහන්නට වෙර වඩන ආධ්‍යා-ත්මිකයනට අසීරු වන බැවින් දහම් ගැට කාරයෝ ම ඒ ගැට ලිහීමට උදව් වීම් වස් ගැටපද ලියූහ.

## සතුම්ඳු

ධර්ම රසය සාහිත්‍ය රසය විනෝද රසය මූළ දෙවා ගුණදම් වගාවට මඟ පෙන්වන රිසින් බැඳුණු රස ගුලාවක් - අමා උලලක් වැනි දහම් ගැට නමින් පතළ ගී පොතෙහි කතුවරයා සදහම් රුවන් වැළ (= සද්ධර්ම රත්නාවලිය) ලියූ හෙළ මහ වියතාණ කෙනකුවූ දහම්සෙන් (= ධම්මසේන) හිමිපාණ යැයි

පතළය. එතුමෝ එදා පරිසරයට අනුව දහම් මඟ පැදියට නැඟුවෝ ගී විරිතිනි. එම සාහිත්‍ය විශාරදයාණන් විසින් ම දහම් ගැට පදඵයන් ලියූ බව කටුගෙයි පොත් ගුළෙහි වූ මෙරුපන්කුලමේ පත්සලේ පොත් පිටුපතින් පෙනේ.

### ගැමපද

එහි ම ඇති තවත් පුස්කොළ පිටුපතෙක "සමස්ත ශාස්ත්‍ර ප්‍රතිෂ්ඨාචායර්‍ය ස්වභාෂා පරමෙශ්වරයා විසින් කථිත ගූඪපදාර්ථ ප්‍රකාස නම් වූ ගැටපදය කියා සම්පූර්ණ කරන ලදී" යනු සඳහන් වේ.

ජයවර්ධන පුර පැරකුම්බාවන්ගේ ගුරු වූ රණස්ගල්ලේ ස්ථවිරයන් විසින් ධම්මසෙන තෙරපාණගේ දහම් ගැට පොතට ව්‍යාඛ්‍යානයක් ලියන ලදැ යි කෞතුකාගාර පුස් කොළ පොත් ලෙඛනයෙහි සඳහන් වෙයි.

### දහම් ගැට සහ පදඵු

ධම්මසෙන හිමියනගේ දහම ගැට හැර තවත් දහම් ගැට පොත් දෙකක් කටුගෙයි පොත්ගුළේ තිබේ. දහම් ගැට සහ පදණී නමින් සටහන් වූ පුස්කොළ පිටු පනහකකි. එහි බොහෝ තැන පද්‍යයන් ගේ පාද වෙන් නො කොට පුස්කොළයේ ලිවීම ඇරඹූ තැන සිට කෙළවර වනතෙක් එක ම ගද්‍ය පාඨයක් සේ ලියා තිබෙනු දක්ක හැක. එහි පළමු වැනි පැදිය ලියා තිබෙනුයේ පේළි තුනකිනි. හේ මෙසේයි.

1. නුඹ තරු පැරයූ ඇස් පොලොපස් දිනූ මස් සුතෙර හිසෙට
2. උස් ඉස් සාගරේ පැන් දිනූ මස් ලේ සිය ගතිනි දිදී දන් සිල් පෙරුම්
3. ඈ පුරා මේ ලොවට සෙත රඳූ තුන්ලො තුමාතන් වදිමි මම්.

මෙය පාද වෙන් කළ විට මෙසේය.

1. නුඹ තරු පැරයූ ඇස් පස් පොලො පස් දිනු මස්
2. සුතෙර ඝිසට උස් ඉස් සාගරේ පැත් දිනු මස් ලේ
3. සිය ගතිනි දිදී දත් සිල් පෙරුම් ඈ පුරා මේ
4. ලොවට සෙත රදූ තුන් ලෝ තුමානන් වඳිම් මම්.

මේ සිලෝව වෘත්තානුකූලව කියවිය හැකි සේ අර්ථයට බාධා නො වන සේ මෙසේ ශුද්ධ කළ හැක.

නුබ තරු පැරයූ ඇස් පස් පොළෝ පස් දිනූ මස්
සුතෙර ඝිසට උස් ඉස් සාගරේ පැත් දිනූ ලේ
සිය ගතිනි දිදී දත් සිල් පෙරුම් ඈ පුරා මේ
ලොවට සෙත සැදූ තුම් ලෝ තුමාණන් වඳිම් මම

අර්ථය සුගම වන බුද්ධාභිවාදන මේ සිලෝව ඇතුළු දහම් ගැට පොතෙන් හා එළු සිලෝ ශතකයෙන් ද කෝට්ටේ සමය එළුසිලෝ යුගයේ ආරම්භය බව සක් සුදක් සේ පැහැදිලි වෙයි.

දහම් ගැට කවි

දහම් ගැට කවි නමින් හැඳින්වෙන තවත් පුස්කොළ පොතෙකි. එහි සත්ත්වයාගේ රූපාදී පඤ්චස්කන්ධයාගේ කෙස, ලොම ආදි දෙතිස් කුණප කොට සේ අස්ථිර භාවය – අනිත්‍ය ස්වභාවය සිවුපද (කවි) යෙන් පැවැසේ. අග මුල නැති කුඩා පත් ඉරු තවයක වූ මේ කුඩා පොත අසම්පූර්ණය. මේ කවි තුනෙන් එම පොතේ හැටි සිතා ගත හැක.

“සො ද අ ග ද එක්වුනු අපි දෙත්තේය
සි ත ප හ ද අට හතු තගත්තේය
ග ත සො මි ද රූ සිරු බබලත්තේය
තෙත තොනි ද සඳහත් කර ගත්තේය

ගල් බඩ කන්ද හැම රස හැරියේ නැද්ද
පිල් බඩ සිටි කැලේ සිවුපා වොද්ද
ගල් බඩ පොකුණු ජල තද වෙල ඇද්ද
තෙල්කඩ ගෙවුනු පාතේ එලිසක් ඇද්ද

තුන් සියයක් ලී දඬු පත් සඳන්දූයි
තව සියයක් වැල් බාතෙන් වෙලන්දූයි
වලා කුලක් ගෙත ඒ බැමි වසන්දූයි
අඩු තුන්කෙලක් කොල සිදුරෙන් වසන්දූයි''

මේ පැදි මහනුවර යුගයට අයත් ජන (ගැමි) කවි ලෙස සැලකිම උචිත ය.

### දහම් ගැට මාලා

දහම් ගැට මාලය (මාලාව) නමින් දන්නා බොහෝ දෙනා දැක පුරුදු කවි පොත වීදගම මෛත්‍රෙය හිමි පාණනගේ රචනයක් බව රට පුරා ප්‍රසිද්ධය. එම පොත වීදගම කෘතියක් නො වන බවත් ඔවුන් වහන්සේ ජීවත් වූ කෝට්ටේ යුගයේ රචනා විලාසයට – මේ හිමි පාණනගේ රචනා ශෛලියට ඉදුරාම වෙනස් මඟක් අනුගමනය කර ඇති බවත් විචාරකයෝ පවසති. පිරියෙසුම් ඇසින් බලන විට ඒ නිගමනය පැසසිය යුතු බවට – පිළිගත යුතු බවට නිදසුන් එම පොතෙන් ම සොයා ගැන්ම අපහසු නො වේ.

22 උ ද ය ගමන් යන්නේ සතර පයකිනි
මැ ද ය ඉර මුදුන යන්නේ දෙපයකිනි
වි ඳි ය සැපත් අවරට ගිය තුන් පයිනි
සොඳය මෙ පද තේරුවොත් නුවණකිනි

32 කලකට කට මවු දෙතනේ කිරි බීමා
කලකට කට රස පලවැල වැළ දීමා
කලකට කට කෙතකට බැඳි වැට සේමා
කලකට කට පට මල්ලේ කට සේමා

කුමර කුමරියන් පවා දත්තා මෙ වැනි තේරවිලි කවි පමණක් නො ව

12 කත් දේ ගෙදර දෙර තවයක් සදලා
තිත් දේ ඉත්ට තද ඇණ යතුරු දලා
බැත් දේ තව සියක් වැල් ගෙන ගොතාලා
මත් දේ යන්නෙ අපි තනියම දමාලා

16 අට සියයක් කඩ සන්දින් ඇති පසියා
තව සියයක් වැල් බාතින් බැඳි පසියා
කරුදෙකකින් උසුලාගෙන යන පසියා
කොතන දමම් දෝ නොදනෙයි කයි පසියා

54 ගොනු ඇවිදින් මඩවල දිය බොන කලට
එනු එඩෙරා කිරි දෙවනට සක වතට
මී දෙන් ඇවිත් දෙසි නෙළමින් සුරත සිට
යනු එඩෙරා හිස් සක වන වනා පිට

මේ ආදී බෞද්ධ දශීතයේ ගැඹුරු දැන් ඇතුළත් සංඛ්‍යා 74 කින් යුත් මෙ පොත බොහෝ වාරයක් මුද්‍රණ යෙන් නිකුත් වී තිබේ.

දහම් කව

ගැට නො ගැසූ දහම් කවි අතර මුල් තැන ගන්නා එදත් අදත් කවදත් ජන ප්‍රිය ධර්ම කාව්‍යය වූ ලෝවැඩ සඟරාව ලියන ලද්දේ ධර්ම සාහිත්‍ය පත පොත සඳහා සිය දිවිය කැප කළ විඳගම මෛත්‍රෙය හිමිපාණන් විසිනි.

**ගැමියන් අතර පවත්නා**
**දහම් ගැට**

පැරැන්නන් අතර කටපාඩම් වූ දහම් ගැට කවි අසන්නට ලැබේ. ගැමියන් විවේක වේලාවල දී විනෝදය සඳහා කියන දහම් ගැට කවි කීපයකි මේ.

වා ද න් නොගෙන සුවදන් ගෙන කාපන්න
මූ දෙන් එතර යාමට බන බැඳ ගන්න
බෝදින් ළඟදී මී දෙන් අඩවා පන්න
නැයන් සමග දෙස් මෝ රදවා පන්න

(අවැඩකරු වාදයෙන් දුරුව සිරි සදහම් නැමැති පිය කරු බස් අසා ඊට යටහත් පහත්ව සසර සයුර එතෙර වීමට ධ්‍යාන භාවනා ආදි කුසල් රැස් කොට අභිමත බොධියකට පැමිණ මිහිකත ගුගුරුවා ද්වේෂ මොහ ආදී කෙලෙසුන් පරදවා නිවනට පැමිණෙන්න.)

තිකුළුන් පස සුවඳ රස ලවණ ගනිමින
බබලන නවරත්න දස මූල් සමව ගෙන
අඹරා සිහ තෙලින් වේලා සැට පැසෙන
වළඳනු මැනවි ඉන් සැම රෝග වැනසෙන

(තිසරණ, පන්සිල්, නවගුණ, දස සිල් රකිමින් බණ දහම් අසා ඒ අනුව පිළිපදින අය සැම රෝගයන් ගෙන් නිදහස් වූ නිවන් දකිත්)

සාවක පස්දෙන මරණෙට අසුකර
පෙරයම බෙර තුන එක ගැසුවොත්
අටවක අට දෙන මාසෙට පස් දෙන
දෙ පෝදට දස දෙන මැරුවොත්
මෙ තුන බලා ගෙන සැම මස් බුදිනට
කෙමනට ගැට්වැල් තුන ලූවොත්
සුර සැප විඳුමට ඇත මේ පින්කම
මවු පිය මැරූ අය නිවන් දකිත්

(ශ්‍රාවකයෙකි, පෙරයම ඡේ හෝ නොහොත් පළමු වයසේ පටන් පළමු වැනි තැන හෙවත් බුදු දම් සහ යන තුනුරුවන එකම සැදැහැයෙන් සිතෙහි තැන්පත් කර ගෙන පස් දෙන යයි කියූ පඤ්ච කෙලශ නසනු සඳහා සිත යොදා අට දිනකට වරක් ඡේ හෝ නොහොත් අටවක පෝය දිනවල අටසිල් ද දෙ පෝ දවස්හි දස සිල් ද මාසේ අනෙක් දිනවල පන්සිල් ද යන මෙකී තුන් අයුරු සිල් රැක සැප අනුභවයට කර්මස්ථාන වශයෙන් අනිත්‍ය, දුක්ඛ අනාත්ම යන තිලකුණු මෙනෙහි කර භාවනාවෙහි යෙදුන හොත් දෙව් සිරි සැප සඳහා මේ පින්කම් ප්‍රමාණ වේ. මවුපිය සංඛ්‍යාත තණ්හා මාන්න නැසුවෝ නිවන් දකිත්.)

දෙ මලෙක් ඇත පෙර සිට මෝ වෙත සිටින
මෝ මැරුවොත් දෙ මලා කුමට රඳවන
මෝ රැකුමක් නැත දෙ මලා මැරුවොතින
නැ රැකුමක් මෝ රඳවන්නෝ මෙතන

(මොහය සමඟ පවතින රාග ද්වේෂ යන මල දෙකකි. මොහය නැසුවොත් රාග ද්වේෂ යන මල (අපවිත්‍ර) දෙක තවත්වන්නේ කුමකට ද? රාග ද්වේෂ යන දෙ මලය නැසුවොත් මොහය රැකුමෙක් නැත. මොහය රඳවා ගන්නෝ රාග ද්වේෂ යන මල දෙක නො රකිත්)

බෝසතාණන් මනු ලොව එළිය දුටු වේලාව දක්වෙන කවි දෙකකි මේ.

ගුරුහාමි ඇද වැටුණයි කකුළු වලේ
හඳ හාමි බබු කිරුවයි වෙළඳ සැලේ
රතු හාමි හත කියමින් මෝර වලේ
කළු හාමි තොන්ඩි ඇත ඇත වැටුණි කලේ

මතමාලය මාලු ගොඩකට යටවෙච්චී
සොම්පුත් එදු එළුගාලට අසුවෙච්චී
වන මැද ගොසින් දෙව් බඹු මූණ ගැස්සිච්චී
මෙ වැනි දුක ඉපදුණි බුදු අප්පොච්චී

(බුදු පියාණන් වහන්සේ මෙලොවට පහළ වූ වේලාවේ ගුරු - කටකයෙහි ද, සඳු - තුලාවෙහි ද, කුජ - මකරයෙහිද, සනි කුම්භ යෙහි ද, සිකුරු - මීනයෙහි ද, බුදහු - මේෂයෙහි ද සිටිය හ)

**නුදුරු අතීතයේ දහම් ගැට**

අදූරාතීතයෙහි එනම් අදට අවුරුදු 125 කට පමණ පෙර තලකඳ වෙහෙර වුසූ මඩිහේ සිරි සුමිතාන ධම්මක්ඛන්ධ හිමියන්* ද දහම් ගැට ලිමෙහි නො දෙ වැනි සමතකු බව "බෞද්ධ ළමයා" සඟරාවේ වරින් වර පළ වූ ඔවුන්ගේ දහම් ගැට පබැඳුම් වලින් මනාව ඔප්පු වේ. ඉන් දෙකක් මෙසේ ය.

නැණ බීපු අද රා මොකෝ අනේ
පාමුලේදි මලසුන් තියා දමා
මා නිසාම අමපාම තුට්වූ දුන්
සැම දුම දියනා බනින් පුදම්

(අද - හෘදයෙහි, අනෝ අනේ රා මොකෝ - අනෙක රාග මොහ ක්‍රොධයන්, නැණ - ඥානය කරණකොට ගෙන බීපු - වහා පිවා වූ (=නැති කළාවූ), පාමූලේදී ( = පාරිච්ඡත්තක නම්) පාදපමූලයෙහි දී - හෙවත් දෙව්ලොව පරසතු රුක් මුල්හි, මලසුන් - (පාණ්ඩු කම්බල ශෛලාසනයෙහි (වැඩ හිඳ), දමා - අභිධර්මය, කියා - දේශනා කොට, මා නිසාම

* මාතර සාහිත්‍ය වංශය (217 - 220 පිටු) මේ හිමියන් ගැන විස්තර දක්වයි.

මාතා දිව්‍ය පුත්‍රයා නිසා ම, අමපාම - සියලු අමෘතපයකට (=සියලු දෙවියනට), තුට්වු දුන් - තුෂ්ටි දානය කළා වූ, දියනා - ජගත් නායක (=ලෝක නායක) වූ සර්ඥයන් වහන්සේට, සැමදුම - සියලු කල්හිම, බතින් - භක්තියෙන්, පුදව් - පූජාකරව්.)

බඹරා අඹරා ගවයන් කළු සක්
ඉහිරි කළයෙන් වස බත් පිස ලු
දිවියා නොයනා තුරු පා ලමිනා
සිමතා කන පාදම දෙන් දිනයා

(බඹරා - බ්‍රහම රාජයා, (= මහා බ්‍රහමයා) ය, ගවයන්- ගවයානයා (=ඊශ්වරයා) ය, කළු - ශ්‍රී කෘෂණ (= විෂ්ණු) ය සක් - ශක්‍රයාය යන, අමරා - දිව්‍ය සමූහයා විසින්, කළයෙන් - කාය චිත්ත ධ්‍වයයෙන් ද, වස, - වචනයෙන් ද ඉහිරි - අධික වූ, බත් - භක්තිය, පිස ලු - පොෂණය කරන ලද්දාවූ (= ආදර ගෞරව කරන ලද්දාවූ), දිනයා - ජිනයාණන් වහන්සේගේ, පා දම - පාලි ධර්මය, දිවියා නොයනා තුරු - ජීවිතය නොඉක්මෙන තුරුම (=දිවි ඇතිතෙක් ම) පා ලමිනා - පව් හැර දමා, මනාසි - යහපත් සිහියෙන් - කණ - කණීයෙහි, දෙන් - දානය කරව. (අසව.)

මේ නොබෝද සිංහල කවියනට ආයුබෝවන් කියා සඳගව් ම වෙන්වූ කවීන්ද්‍ර ආනන්ද රාජකරුණා (සසුන් ගත වූ සසු ආනන්ද ධම්ම හිමි) මහතා සිනහ රසයෙන් කුල්මත් කරවන දහම් ගැට ලිවීමෙහි ගජ සමතෙකි. සූරයෙකි.

*"ගැණු අත වැණුම තරි වාදත් කුමට
මූණු තැනලගෙ හිමියෝ සිඹින විට
තණ නටවත්ට කී පින්හාමි අසියට
පණ - මක් තුට්වු දෙව පිහිටයි දවාලට

* 1922 ජූලි - ශ්‍ර ධර්ම ශ්‍රී

(මොකට – මොක්ෂය සඳහා, මූණු – මූ කරණු නොලද, නැණ ලගෙ – ඥාණයන්ගේ, හිමියෝ – ස්වාමීහු, ගැණු අත සත්‍රීන් පිළිබඳ, වැණුම – වර්ණනා කිරීම් සංඛ්‍යාත, නරිවාදන් – අනාර්ය වචනයන්, සිඹින විට – චුම්බනය කරන කල්හි, තණ –තෘෂ්ණාව, නටවන්නට – නෂ්ටකිරීම පිණිස, කී – කථනය කළා වූ, පින්හාමි – පුණ්‍ය ස්වාමි වූ, අයියට – ආර්යයන් වහන්සේට, තුට්වූ – සන්තුෂ්ට වූ, පණමක් – ප්‍රණාමයක්, දෙව දූතය කරව, දුවලට (සංසාරයෙහි) ජාති වලට, පිහිටයි – ප්‍රතිෂ්ඨ වෙයි

** ගීතට් කොටමි බත් පිස ලමි තුට්වූ වක
ගැට අඹ කපා දෙසි මිරිකමි නැත ගොරක
ලූණු ලා බෙදමි ඇමට ම ඉන් අපට මොක
දූක් වූ නැනා ගෙ නම කරණු රූ දෙක

(ගීතාධ්‍යාසයෙන් චූර්ණ කොට ලමි. භක්ති පොෂණය කරමි. (හොඳ) තුෂ්ටියක. අම්බිකා (පලිබොධ) ගණයා ජේද කොට වෛෂය මර්දනය කරමි. (එකල් හි) නොරොක් භාවය (ද) අවිද්‍යමානය. සියලු සත්වයන්ට චින්තන කරුණා දක්වමි. එනයින් අපට මොක්ෂය දක්වා වදාළ ඥාණානාවබොධයන් වහන්සේගේ (කාය ධර්ම සංඛ්‍යාත) රූප යුග්මය නමස්කාර කරණු. )

** අයියෙ අයියෙ තුන් මෝදර ගිලෙන රඟ
දූනගත් නැනොත් වෙයි නරියා කැලේ වග
ගෙයි මිනිහාට මෙලෙසින් කී මුත් නෙ වග
නමදිව් සිරිදියස් ජයකොඩි ගුණ තුංග

---

** 1922 සැප් – ඔක්, ශ්‍රී ධර්ම ශ්‍රී.

( ආඝීය, ආඝීය, (අකුසල් මුල් සංඛ්‍යාත ) ත්‍රිවිධ මුඛ ද්වාරයෙහි නිමගත වනාකාරය ජාතනය කරන්නේය. එසේ නැත. අනාඝී සමූහ වර්ගයෙහි වන්නේය. ගෘහස්ථයාට මෙ පරිදි (සංසාර) මුක්තියෙහි මාර්ගය වදාළා වූ ජයධවජ ගුණොත්තුංග වූ ශ්‍රී ජගදක්ෂීන් වහන්සේ නමස්කාර කරව්)

මේ ඈ ඔවුන්ගේ දහම් ගැට "ආනන්ද රචනා" හි ද පළව තිබේ.

"සිනාසිසී තරවෙන්න" යන කීමට සරිලන ප්‍රහෙලිකා වූ ගැටළු කවි නැනුමෙහි අති දක්ෂයෙකි මාතර මහා මන්ත්‍රී නදී පිරිවෙණාධි පතිව වැඩ වුසූ බැඳිගම රතනපාල නායක හිමියෝ. කුරක්කන් ගල, ජල තලය ආදිය පිළිබඳව ලියූ ගැටළු කවි බැලූ වරට අසභ්‍ය වදන් සේ පෙනෙතත් අර්‍ථාන්විතය. සිනා රසයෙන් මත් මත් කරන සුලුය. ඒ කවි බොහෝ දෙනා අසා පලපුරුදු ය.

සමස්‍යා පූරණ, හරස් පද ප්‍රහේලිකා, දුෂ්කර බන්ධන, ඒකාක්‍ෂර බන්ධන, ගණිත ගැට ආදී ගැටළු පිළිබඳ නො එක් හෙද විස්තර විසින් ලිවීමට මේ නො තැනි.

දහම් ගැට සංස්කරණය

දහම් ගැට නමින් පතළ මේ පොත සකස් කිරීමේදී කෞතුකාගාර පුස්තකාලයෙහි වූ පදළු සහිත පුස්කොළ පිටුපත් දෙකක් හා ක්‍රි. වර්‍ෂ 1887 දී මුද්‍රිත පොත ද අපට බෙහෙවින් උදව් විය. එක පුස්කොළ පිටුපතෙක සමහර ගී කිහිප පලෙක පුන පුනා ලියා තුබුණි. අනෙක් පැදි අවුල් ලෙස ලියාතුබුණු අතර ලේඛකයන ගේ අනවධානයෙන් වූ වරද තැන් ද බොහෝ විය. මේ පිටු පත් තුන හා සසඳා පෙළ සකස් කළෙමු.

මුද්‍රිත පොතේ හා පුස්කොළ පිටුපත්හි පැදිවල අනු පිළිවෙල බොහෝ තන්හි වෙනස්ය. එවැනි කිහිප තැනෙක අපගේ සංස්කරණයේ වරහන් ඇතුළේ 1887 මුද්‍රිත පොතේ අංක සටහන් කළෙමු. අමුද්‍රිත පුස්කොළ පිටුපත්හි අා අයුරු සැසඳීමෙන් මේ සැකැස්මේ අංක සටහන් වී ඇති බව සලකනු සෙහේ.

පුරාතන ව්‍යාඛ්‍යාන ඇසුරෙන් මෙහි පදගතාර්‍ථ දී ඇතත් දහම් පත් පොත්හි ආ කරුණු හා සුදුසු තන්හි පරිකථා හා විස්තර වර්‍ණනා ඇතුළු කිරීමට නො පසුබට වීමු.

ජී. ඩී. ඇස්. වීරසූරිය

2502 / 1958 ජූලි මස 4 දා
ගන්දර,
කපුගම – කෝට්ටෙගේතේ
"ප්‍රියාවාස" යේ දීය.

# දහම් ගැට

——:(:):——

## නමවූ මුනි සරණ

---

1 සෙත ලෙස නො වියතුන්
වියතුන් ඉස් සල සලා
සොයතෝවි අරුතු තෙපුල්
සවත මිණෝවි දහම්ගැට

2 සාවක සඳින් ගෙත
පාදම් අටක් ගැටලා
සතර පා හිසලා එම
පා දමින් බැඳ පවිම් අද

3 මී අඹ සක්කරා
බඹරා සඳ පාත කා
ගවයන් බණ සඟ සවත
දෙව් ලෝ අතත් සුව දේ

4 සඳුන් සුනු පල්ලේ
හිය මී අඹ කකා රා
කිරි දී මෝරු ගෙත තැගි
වදුරු දූරියන් සරණේ

5 මහ මී සතසලා
පිළවුන් මැඩ වල දමා
සඳුන් පැන් වත් කොට දී
වළඳා වදුරු තැංගේ

6 තපසිවරිති දූත්
සහසං තණ මරත්තේ
දෙ කෙත හෙළි කොට ගෙනලා
සෑ බෝ මතු කොටත්තේ

7 ක බල තො බිදෙන තුරු
ලුණු ලා අද තිබූ නම්
ක බල බුතොතිනුත් ලුණු
තො තසී සෙට වත තුරා

8 තො ලදින් දූන් කසා
සමණන් සොයත දූරියන්
සඳුන් සුනු තබා තො බා
යන්නේ කසා වත්තට

9 ඉස්සත් සොයා ගොස්
සෑසී රතට දුලදින්
දළ පිය පතු පොවා මග
දිරා ක ළයෙන් හැරපූ

10 අරේ පිබිදී ගොස්
දසක් දමා ඉස්සත්
රත් දී රිදී ගෙන එම
ඉස්සත් ඉස පිසූ වේ

11 සමණන් දූක කැකිරි
පිස දී සතර පස් දා
නිවත් යත දූරියෝ තව
සමණතට ම දිවි පුදත්

12 තණ දවලට ගොස්
අඹරා ගනුව පාදම්
කුණු අමුඩු ගලවා මෝ
රපු දූරියෙනි නිවත් යවු.

13 රා කළයෙන් ගෙනා
ඉස්සත් ඇතිළියේ ලා
ඇම රා පිසදි නො සි දු
වල් ගොස් සාවුන් ගත්තේ

14 ලුණු ලා දියත ඉස
පල් ලේ සදුන් සුනු හෙළ
කිරි කකාරා මී දී
මූදවාපු බුදු ගත්තෝ

15 වැර සැර පිරිමියෙක්
තෙමේ දු වල් ගොස් සිට
සතක් කැති ගෙන්වා එකැ
තිති සත්වත්ත ඉදි කෙළෙ

16 ඉස්සත් සොයන්නත්
ලුණු ලා අද ඉසි පනු බොන්නේ
දඩ වැද සතුන් විද
වන හා කා තිවත් යත්තේ

17 ම සමණෝ දුරි ඇත්තෝ
මම දුරි නැත්තෙම් වෙමි
තොප බෙලෙනී මතු
නැණට මා දුරි ඇති වත්තේ

18 දුරි ඇති විම් තම්
නැණ හා එකගයෙන් තම
සමණත් ඇයි ද මට දුත්
රා පලා වක් ලදිම් තම්

19 තව එතර නො ගියෙම්
ම සමණෙනී මානියෙනී
සතර වන මගලේ
සරණ දී මා එතර ලත්තේ

20 බවා නුමුත් මඟ
තැණ දක්නා තෙක්
මොර පූ කළ දෙව
එතර වන්නට සිතමු සෙත් සුබ

21 කා බවා වල් ගොස්
සතුන් විද සම් හැර ගෙන
මඟ මූවා පලා දකු
ගොස් වන පියාණන්

22 දර සොයා තො යවූ
සතු සොයා වලට යවූ
තම්පලා කඩවූ
තැණ නිත්තෙන් පූ පිසවූ

23 දර සොයන දූරියෙනි
කවූ දර තො අල්ලන්නේ
පැළි දර සොයන්නේ පැළි
දර බෙලෙනි පූ පිසන්නේ

24 වදුරු තැඟෙන්නට
දකුමැතියෝ පලමූ ද
සක් සුනු සඳුන් පැන් දී
කිරි මූදන් මී කකාරා

25 රන් දී පන්සිල් ගෙන
දූරි ඇති මෝ රා දෙසි
පැන කඩා කා ගී සීනෙන්
මඟ පලා බව් දනු

26 තියඹරා මල් සමයට
හැම දූරියෝ ද මිදු වෙත්
කැකිරි දලු කඩත් කුර
සාමූලයෙන් උපුටත්

27 දිවියා නො යන තුරු
වල් පත ගනුව ඉඳුරා
පලා ගිය තමූත් දිවි
සම වරදි බවා තරවා

28 තම් පළා කැඩවූ
ගීතටි වී ගෙත වතවූ
තෙල් සොයා දිවවූ
ක බල බිඳලා නැණ නො මැ සෙවූ

29 සැසි පතා ලත්
නැණ සමණන් ඉන්ද දී
සරණැතියෙම් අතිස
පර සමණත් ඇසි ද මට

30 සමණෝ කිපෙත් තම්
තව කෙසේ සතහම් තම්
සමණෝ දත්තු තම්
වැද්ද නො ම දෙති කසා වත්තට

31 තපසීවරිති දූත්
ගිතටි වී වතාලා
සමඟ වළදත්තේ
අතිස පූ පිස සතර සත්තෙත්

32 පල් පලා දෙත්තේ
සකසා සා බත් බළාලා
එදා අග තැංගේ
මෙදා සදා මරුත් බුත්තේ

33 දිය පිට ඉස්සත්
යත්තා දූක දතා මිත්
දමා දළ බිලි සාවක
ගත්තත් දනු මෙ දීයේ

34 කාරා වට නො ගොස්
දම කත කොස් ලූ නම්
අඹා මහ පලා ගෙන
මෝරා ගිය කියන්නෙම් කියටි

35 සී වැස්සෙනි පතවු
තර කය සරා කාලේ
සතර පස් සාර්වක ගෙන
මස් පිසන්නේ තර කයෙනි

36 තර කය පතන්නේ
ලුණු ලා බත් පිසන්නේ
ඉසි පතු බොන්නේ
සුව දියෙනි සෙට බුදු වන්නේ

37 වල'සුත් ඇර වගුත්
දළ බිඳ සක් දමාලා
මඟදී එවිගස ම නැඟි
අටළොස් කෙලෙස් පණුවන්

38 දමූ කබ තමා කා
සතුරනට බත් දෙන්නේ
මහණුන් බවන්නේ
තත රත් වතිනි නිවන් යන්නේ

39 ගුණ ගෙන පා පියා
ක ළයේ රා බී පියා
මසුරන් ඉස පියා
නිවන් යන්නේ තණ ද පියා

40 දිරා ලෙඩ මළ
සමණන් දැක සතොස් මිත්
සැසී එද දුරි ගියේ
එරාහුලලා පියවා

41 සැසී කතුරු දිය
රස බී තුටු මුරුංගා
අවල කෙළි කෙළි ද
කැඩුව වතු අත්තෙන් තම් පළා

42 අඹු පිස දුමාලා
සිල් කා ළයේ පුරා ගෙන
තිවන් යන දූරියෙනි
සතර බණ වර කරඬුවේ ලවූ.

43 ඇඳුරා තැගු ගෙයි
දඹුපත් හැම විඳ හැර
මඹුලු සුත්බත් කොට
තෙපිදු බුදුවත්තට තණ දවවූ

44 වඳිම් තුන් ලෝ නැති
නූපන් බුදුන් තො මියත
සතර ඉරියව්වෙන්
රුසිරි දී දම් දෙසුවන්

45 ආඳි මල සමණත
පසුව මල ද ගෙන දවාපු
තවන් තො මළ දූරියෝ
පතත් තුන් වත වර මියත්තත්

46 මතු බලල් මස් මී
වත පළා මල්ලා
බුදු වත්තේ සැබවින්
තවක් රත් තම්පළා දෙ නුවන්

47 මෙ වර මෙ දෙ කුඹුරේ
කර තණ පුරා තැංගේ
හිතටි තො තැංගේ
එසින් දම ළ තො ලා හුත්තෙම්.

48 තණ ගේ විදු හැර
බෝ පා අඩවියේ දී
සද්දු මුළුල්ලේ
එදුරි දවසැරි පලා කාලා

49 පූ පිස තබා ලා
බණ ගෙට ගොස් සයිත් ඉඳ.
දම්මා දම් සගුණ බලා
සද්දවසකින් නිම වූ

50 ආදි දූරි ඇත්තත්
අඹුවත් මරා ලුහුබැඳ
අද පා මුල සයින්
සද්දු උත්තු සමණෝ

51 දූත් පුහුදුන්තෝ
නරකය ලබත් මත්තෙහි
සැබැවිය නො ලබත්තෝ
නරකය නුපුහුදුත්තෝ

52 එසා සත් සෙතගක්
එක ඇතු පලා ගිය ද
අඹා පසල දී ගොසින්
ලුණු බැඳ ගත්තු වල්පත

53 සුනු වත හැර පියා
උප්පත මඟ හෙලා ගෙත
දූත් සතුටුව කොයි ද
නැණඹිනි දිවත්තෝ

54 අඳයට දෙ මස්සක්
පෙර දී ලා ම සමණෝ
දූත් සතරක් ලද්දු
වරෝ රත් කෙළියට දූරියෙනි

55 කුදලා සමඟ ගොස්
සත් රජයෙක ගොපොල්ලෝ
රත් දී රිදී ගෙන
තවත් තණ ද රජ කළෝ

56 නො සලා එද දුත්
පිටුයෙත් පූ පිසුයෙත්
සයින් සිට සද්ද දී
දව හළ සතර මස්සක්

57 සව්ලයත් ඇතැයි
මඟුලට දූපටත් ගෙන ලා
තැත්තෙත් සව්ලයත්
මඟුල් තිබියේ එරාහුලලා

58 මී දෙන දමා පි
වස්සත් උතාපි
අමුඩු ගලවාපි
ගොපොලු දිව ගොස් ලො වළඳපී

59 සැසී සැසී දූරි
සඳු ද මැද පියා දත්
බැව් මෙතෙක් ද
සතර වත ද කැය කිරිබත්.

නිමි.

# ලකුණු විස්තරය

---

ප: පද්‍ය

සං: සංලක්ෂ්‍යය (විස්තර වර්ණනා, පරිකථා)

පි: පිටුව

# දහම් ගැට

---

- පදැවි
- සංලක්‍ෂ්‍ය (විස්තර වර්‍ණනා, විවරණ, පරිකථා)

# දහම් ගැට

1. පදාර්ථ:- නො වියතුන් - අව්‍යක්තයන්, සෙත ලෙස- සිනහ කර(ව)න ලෙසට ද, වියතුන් - ව්‍යක්තයන්, ඉස් සල සලා - හිස සොලවමින් (ප්‍රශංසා කරන ලෙසට) ද, අරුතු නෙපුල් - අර්ථාන්විත වචනයන්, සොයනෙව් - පරීක්ෂා කරන මෙන්, සවන මිණෙව් - ශ්‍රවණාලඞ්කාර මණි කුණ්ඩලාභරණ-යකට (කන සරසන මැණික් අබරණයකට) බඳු වූ, දහම්ගැට- ධර්ම ග්‍රන්ථි නම් වූ ප්‍රබන්ධයක් (කෙරෙම්.)

සංලක්ෂ්‍ය: 1. සොයනෙව් (සොයන + එව්)

2. මිණෙව් (මිණ + එව්)

2. ප:- සාවක - ශ්‍රාවකයන්ගේ, සඳින් - චිත්තයෙන්, ගෙන - ග්‍රහණය කොට, පාදම්- පාළි ධර්ම නැමැති, අටක්-මුක්තාහාරයක්, ගැටලා - ග්‍රීවයෙහි බහා, සතර පා-ශාස්තෘන් (සර්වඥයන්) ගේ ශ්‍රී පාදය, හිස ලා - හිසෙහි පිහිටුවා, එම පා දමින් බැඳ - එම ශාස්තෘන් ගේ පාළි ධර්මයෙන් ගෙන පද බැඳ-ලා (රචනා කොට), - අද - අමුතුව, පවිම් - ප්‍රකාශ කෙරෙමි.

සං: 1. සාවකා:- "සුනොතීති සාවකො" අසාතු යි ශ්‍රාවක නම්. සාවක සංඝො - බුදුන් වහන්සේගේ ආර්ය සංඝයා ශ්‍රාවකයෝ ය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිස ය ශ්‍රාවකයෝ. බුදුන් වහන්සේගේ ධර්මය අසන්-නෝ ය. ඒ අනුව පිළිපදින්නෝ ය.

2. සඳින්:- චිත්තයෙන්; (හෘද් > හද > සඳ) හ- කරට ස -කර අදෙස් වූ මෙවැනි තැන් විරලය. සිරියල්- එවැනි තැනකි. (හරිතාල > හිරියල් > සිරියල්)

**3. සතර:-** ශාස්තෘන් වහන්සේ. "දිට්ඨධම්මික සම්පරා-යික පරමත්ථෙහි යථාරහං අනුසාසතීති සත්ථා" මෙලොව පිළිබඳ අභිවෘද්ධිය, පරලොව පිළිබඳ අභිවෘද්ධිය, ලොකො-ත්තර අභිවෘද්ධිය යන ත්‍රිවිධ සම්පත්තියෙන් දෙවියන් මරුන් බඹුන් තරන් සහිත හැම සත්නට ඔවුනොවුන් චරිතයට අනුකූලව අනුශාසනා කරන හෙයින් බුදුන් වහන්සේ "ශාස්තෘ" නම් වන සේක. සසර කතරින් එතර කරන සේක. ත්‍රිවිධ අර්ථයෙන් අනුශාසනය කරන සේක. යන දෙ අරුතින් "ශාස්තෘ" නම් වන සේක.

මෙසින් මුල් අරුත පමණක් ගෙන විදගම මාහිමියෝ මෙ සේ කියති.

"බව කතරින් එතර
ලනුයෙන් සතන් හැම වර
තිලෝගුරු මුනිවර
වීය සත්තා නමින් පුවතර

(බුදු ගුණ අලංකාරය)

**8. ප:-** මී අඹ - මහී කාන්තාවය, සක් - ශක්‍රයා ය, බඹරා - බ්‍රහමයා ය, සඳ- චන්ද්‍රයා ය, පාන - සූර්යයා ය, කා- අහස ය, ගවයන් -ඊශ්වරයා ය, බණ-ධර්මය ය, සඟ- සාංඝිකයා ය, සවන -සර්ඥය (යන මේ) දෙව් - දේවයෝ, ලෝ - ලෝවැස්-සනට, අනන් - අනන්ත වූ, සුව දේ - යහපත ප්‍රදානය කෙරෙත්වා.

සං: **1.** **මී අඹ:-** (මහී අම්බා) මිහිකත, පොළොව.

**2. සක්කරා:-** (සක්කො) ශක්‍රයා; සක්කරා, සක්කරයා යනු ද බැවහර වේ.

**3. බඹරා:-** (බ්‍රහම) බ්‍රහමයා, බඹු.

**4. සඳ:-** (චන්ද ) සඳ, චන්ද්‍රයා.

**5. කා:-** (ඛං) අහස.

**6. ගවයන්:-** (පසුපති) ඊශ්වරයා.

7. බණ:- සූත්‍ර, අභිධර්ම, විනය යන තුන්පිටකය ධර්ම ය යි. සෝවාන්, සකෘදගාමි, අනාගාමි, රහත් මාර්ගඵල අට සහ නිවන යන මොහු නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මය වෙත්.

8. සඟ:- සිවු නමේ සිට ඉහළට සංඝයා ය. සංඝ යනු සමූහයට නම්. සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණි උතුමෝ අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝ රත්නය වෙති. ආර්‍ය සම්මුති වශයෙන් දෙ පරිදි ය.

9. සවන:- සබ්බඤ්ඤු - සර්වඥ; සියල්ල දැනගත් තැනැත්තා යන තේරුම යි. පංචවිධ ඤෙය්‍ය මණ්ඩලය දැනගත් - අවබෝධ කරගත් නිසා "සර්වඥ" ය යි කියනු ලැබේ. සංස්කාර, විකාර, ලක්‍ෂණ, නිර්වාණ, ප්‍රඥප්ති යි කොටස් පසකට බෙදන ලද්දේ (පංචවිධ) ඤෙය්‍ය මණ්ඩලය යි. දතයුතු දේ සියල්ල යන තේරුම යි.

"න තස්ස අද්දිට්ඨ මිධත්‍ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතම ජාති තබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්‍ථි ඤෙය්‍යං
තථාගතො තෙන සමන්ත චක්ඛු" .

බුදුන් වහන්සේගේ සර්වඥතාඥනයෙන් නුදුටුවා වූ ද, නො දැනගන්නා ලද්දා වූ ද, දත නො හැකි වූ ද කිසිවක් නැත්තේ ය. දතයුතු යම්තාක් දේ වේ නම් ඒ සියල්ල ම දැන වදාළ සේක. එම නිසා බුදුන් වහන්සේ "සමන්තචක්ඛු" නම් වන සේක. කැමැති යම් දෙයක් බැලීමට කිසි ම ඇවුරුමක් නැති හෙයින් අනාවරණඥනය යි ද මේ සර්වඥතාඥනයට ම නමෙකි.

"සබ්බඤ්ඤුත ඤාණං පන කාමාවචරමෙ'ව ලොකියමෙ'ව" සර්වඥතාඥනය කාමාවචර ය එහෙයින් ම ලෞකික ය. මේ නුවණ ලොකොත්තරය යි කියතොත්, භක්තියෙන් මුළා වී කියන කීමෙකි මේ නුවණට පවා ගොදුරුවන්නේ බැලූ බැලූ දේ පමණය. බැලූ බැලූ කෙණෙහි ඒ ඒ සියලු අරමුණු ම ගන්නට සමත් වන්නේ ඥන සම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා ජවන් සිත් මැයි. ඒ සිතින් ම බුදුන් වහන්සේ

බැලිය යුතු තාක් දේ බලන හෙයින් ම එහි යෙදුන බුදු නුවණ ම සව්නෝ දත් නුවණ වන්නා සේ ම එය කාමාවචර සිත්හි යෙදුන බැවින් කාමාවචර වේ. එම නිසා ලෞකික ද වේ. ලෝකෝත්තර සිත් අටෙකි. එනම් සෝවාන් ආදී මාගී ඵල යන සිත් අටය. එයට අරමුණු වන්නේ නිවන් මැය. එම නිසා නිවන් හැර ඒ සිත් අටෙන් වෙන දෑ බැලිය නො හැක. ලොව ඇති තාක් සියලු දේ බලන්නට නම් මුලින් සඳහන් කළ කාමාවචර ක්‍රියා ජවන් සිත්හි යෙදුණු සර්වඥතාඥානය උවමනා ම ය.

10. මී අඹ:- පොලෝ - මහීකාන්තාව නම්. පොළොවට අරග්ගත් දෙව් දුවක යනු පැරණියන්ගේ නිගමනයෙකි.

පොලෝ - මහි කාන්තාව ගැන මා ඇගි වැදගත් විස්තර- යක් මෙ සේ ය. "මරසෙනහට බිය වූ සියලු දෙවි බඹුන් අප ශ්‍රී මහා බෝධි සත්ත්වයාණන් වහන්සේ තනිකොට පලා ගිය කල්හි මිහිකත නැගීව පෙම්බර මවක මෙන් ද ඉතා හිතවත් ඇසියක මෙන් ද විදුරසුන මහ බෝසතාණන් වහන්සේගේ ම බවට සාක්ෂ්‍ය දුන් සැටි කාම්බෝජ - සියම - බුරුම යන රටවල විහාරයන්හි සිතියම් කොට තිබේ. මින් අවුරුදු 200 කට පමණ පෙර වැඩ වුසූ සියාම රාජවංශික ස්ථවිරයන් වහන්සේ නමක විසින් ලියන ලදැ යි සලකනු ලබන "පඨම සම්බෝධි" පාළි පුස්කොළ පොතක් කාම්බෝජ රටේ දී දක්නට ලැබිණ. කාම්බෝජ අකුරින් පිටපත් කර තිබෙන එය පරිච්ඡේද තිසකින් යුක්ත ය. මෙහි මාරවිජය නම් පරිච්ඡේදයෙහි ලක්දිව අපගේ පොත්වල දක්නට නොලැ- බෙන කරුණක් වෙයි.

මාර දිව්‍යපුත්‍ර තෙමේ බෝමුල වැඩහුන් මහ බෝසතා- ණන් වහන්සේ වෙතට ගොස් 'සිද්ධාර්ථය! ඔය විදුරසුන මාහට දී නැගී යව' යි කීය. ඉදින් මහ බෝසතුන් බුදුවන දවස මතුවන විදුරසුන මාරයාහට නො ව බෝසතුන්හට ම හිමිය යි අප ශ්‍රී මහා බෝධි සත්ත්වයන් වහන්සේ වදාළ කල්හි එ සේ නොව එය තමාගේ බව මාරයා නැවතත් කීයේ ය. "එ සේ ය. එ සේ ය. විදුරසුන වසවත් මරුගේ යසි"

මාරසේනාවෝ ද පොළොව පැළී යන තරම් වූ මහ හඬින් සාක්ෂ්‍ය දුන්හ. "සිද්ධාර්ථ ය" විදුරසුන තුඹ ගේ බවට තුඹට සාක්ෂ්‍ය කොයි දැ යි, මාරයා මින්පසු ප්‍රශ්න කළේ ය. එබසට අපගේ සවාමිදරු වූ ශ්‍රී මහා බොධිසත්ත්වයන් වහන්සේ "මා වෙනුවෙන් සාක්ෂ්‍ය දීමට මෙහි මාගේ මවු කෙනෙක් හෝ පිය කෙනෙක් හෝ අන් කිසි හිතවත් කෙනෙක් හෝ නැත්තා හ" යි වදාරා මිහිකත අමතා "පෙර නොයෙක් ජාතීන්හිත් වෙස්සන්තර ජාතියෙහි දී ත් මා වෙනුවෙන් නොයෙක් වර අඩා දූන් කවර හෙයින් නිශ්ශබ්ද වන්නෙහි දැ" යි අසන්නාක් මෙන් රන්වන් දකුණත චීවර ගර්භයෙන් ඉවත් කොට පොළොව දෙසට දිගු කළ සේක.

ඉදින් කාම්බෝජ රටින් ලැබුණු පඨම සම්බොධි නැමති පොතේ සඳහන්වන පරිදි මහ බෝසතාණන් වහන්සේ මෙ සේ තමා දෙසට ශ්‍රී හස්තය දිගු කළ වහා මහීකාන්තාව පැන නැගී මහ සතාණන් වහන්සේ ඉදිරියෙහි සිට:- "මහා පුරුෂයාණන් වහන්ස, ඔබගේ පුණ්‍ය සම්භාරය මම දනිමි. ඔබගේ දක්ෂිණෝදකයෙන් මාගේ කෙශයෝ තෙත් වූහ. සවාමිදරුවාණනි! දූන් මම ඒ ජලය මුදා හරින්නෙ මැ" යි කියන්නාක් මෙන් තමාගේ දිඝී වූ කෙශ කලාපය ගෙන මිරිකුවා ය.

මහ සතාණන් වහන්සේගේ පාරමිතාවනට සාක්ෂ්‍ය වශයෙන් මහී මාතාවන්ගේ කෙශ කලාපයෙන් මහවතුරක් හට ගත. මර පිරිස සිට ගත නො හැකිව පළා ගියා ය. පැරුම් බෙලෙන් මහ බෝසත්නට ජය ලැබිණ. දෙව් බඹහු පැමිණ "ජයො හි බුද්ධස්ස සිරිමතො අයං මාරස්ස පාපිමතො පරාජයං" යි ගායනා කරමින් ජය මඟුල් පැවැත් වූ හ.

මහීකාන්තාව යට දක් වූ පරිදි තමාගේ කෙශ කලාපය මිරිකන ආකාරය කාම්බෝජයේ බොහෝ විහාරාරාමයන්හි සම්බුද්ධ ප්‍රතිමා වහන්සේට යටින් දක්නා ලැබේ". [1]

1. පූජ්‍ය නාරද හිමියන්ගේ ලිපියක් – බු. ව. 2483 බෞද්ධ ළමයා – වෙසක් කලබ

අනුරාධපුර අසදිස රුවන්වැලි මහ සෑ මලුව කැණීමේ දී නො බෝ ද මහිකාන්තාව ගේ පිළිරුවක් පුරා විද්‍යා මණ්ඩලය මගින් සොයා ගෙන තිබේ. එය මහජනයාගේ දර්ශනය සඳහා ප්‍රදර්ශනය කර තිබුණේ ය.

**4. ප:–** මි අඹ – මහී කාන්තාව, කකාරා – ගුගුරුවා (කම්පාකොට), සඳුන් – සත්‍රින් (අඹගතාවන්) ද, සුනු – පුත්‍රයන් ද. පල් – මස් ද, ලේ – ලේ (රුධිරය) ද, හිය – වාහන ද, කිරි – ඇතුන් ද, දී – දීලා, මෝරු ගෙන – ගිරි මෙබලා තැගී ආ මාරයා ප්‍රලය (පරනයනය) කොට, වදුරු තැගි – වජ්‍රාසනාරූඪ වූ, දූරියන් – බෛසීවතුන් වහන්සේ සරණේ - සරණ ගනිමවු.

**සං: 1. වජ්‍රාසනය:–** කෙනකුට වෙනස් කළ නොහැකි නො බිඳිය හැකි ආසනය යන තේරුම යි.

"ජඞ්ඝාභ්‍යාං වජ්‍රවත් කෘත්වා – ගුද පාර්ශ්වෙ පදෞ වුභෞ
වජ්‍රාසනං භවෙදෙතත් – යොගීනාම් සිද්ධි දායකම්"

කෙණ්ඩා දෙක දියමන්ති මෙන් දැඩි කොට දෙ පතුල් ගුදමාගීය දෙ පස තැබීමෙන් මේ යෝගීනට සිද්ධිදායක වූ වජ්‍රාසනය වන්නේ ය.

දැනට වජ්‍රාසනය වෙනුවට විසිතුරු කැටයමින් නිම වූ ගල් අසුනක් සිරි මහ බෝ රදුන් ළඟ තබා තිබේ. එය පසු කලෙක තැබූවෙකි. දිග පුළුල අඩි 7. 6", 4. 10". ක්‍රි: ව: 629 දී ඉන්දියාවට පැමිණ පුරා හවුරුදු 16 ක් එහි වාසය කරමින් තොරතුරු සපයා - ගත් චීනජාතික හියුං්සියැං තෙරණුවෝ බුද්ධගයාවේ බෝමැඩ වජ්‍රාසනය ගැන මෙ සේ සඳහන් කරති.

"ප්‍රාකාරය තුළ (සිරි මා බෝ වටා) භූමි භාගය ශුද්ධ වස්තූන්ගෙන් අතර තැතුව පිරී පවතී. දඹදිව නො එක් රට වැසි රජුන් රජකුමරුන් සිටුවරුන් ආදී නො එක් දෙන කර වූ ස්තූපයෝ ද, පිළිම ගෙවල් ද, එකිනෙකට හැපී පවතින්. මධ්‍යයෙහි වූ බෝගස අවට වජ්‍රාසනය

පිහිටියේ ය. පෑපිවියේ නාභිය වූ මෙහි මැවුණු මේ වජ්‍රමයා සනය පියවර 100ක් පමණ වට ඇත්තේ ය. භද්‍රකල්පයෙහි පහළ වූ ද පහළ වන්නා වූ ද දහසක් බුදුවරු මෙහි වැඩ හිඳ වජ්‍ර සමාධියට සමවැදුනා හ. සමවදින්නා හ. අප බුදු රදුණෝත් මෙහි හිඳ ගෙන සම්‍යක්සම්බෝධිය ලැබූහ. බෝධි මණ්ඩය යි ද කියනු ලබන මේ ස්ථානය පොළොව කම්පාවන විට නො සෙල්ලී තිබෙයි. බුදු සසුන විනාශ වූ කල මෙය පසින් හා ධූලියෙන් වැසී නො පෙනී ය යි.''

2. මෝරු:- ගිරිමෙඛලා ඇතා. බුදු වන ද වසවත් පැමිණියේ මේ ඇතු පිට නැගී මහත් වික්‍රම අනුභාව ලීලාවෙනි.

''වසවත් මරහු නැගි ආ සෙළ සියයක් යොදුන් දිග ඇති අනූ යොදුන් උස ඇති ගිරිමෙවුලා ...'' (සද්ධර්මරත්නාවලී).

''සෙළ සියයක් (=150) යොදුන් ගිරිමෙවුලා නම් ඇතක් හු නැගී'' (බුත්සරණ)

ඒ ඇතු ගැනත් වසවතුගේ සවභාවය පිළිබඳවත් ජයමංගලගාථා අෂ්ටකයේ මුල් ගාථාවේ මෙ සේ සඳහන් වේ. ඒ මෙ සේ ය.

''බාහුං සහස්සමභිනිම්මිත සායුධන්තං
ගිරි මෙඛලං උදිත ඝෝර සසේන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි''

එහි හෙළානුවාදය - මෙන්න.

''ප ත් වත් වත් වසවත් මහත් සෙනග යුත්
සැත් ගත් මතැත් මත් අරා
ය ත් යත් සිත් බියපත් වැ සක් සතන ඈ
තත් තත් තෙදැත්තත් පවා
ද ත් සිල් ඈ පෙරුමත් බෙලෙන් දිනි මරුත්
මාසත් එසත්වා බෙලෙන්
වෙත් වා නිත් ඔබටත් උතුම් ජයමඟුල්
බෝකල් මුළුල්ලේ තුමූල්''

5. ප:- මහ මී – මහා පෘථිවිය (පොළොව), සත් – සත් වාරයක්, සලා – සොලවා (කම්පා කරවා), පිළවුත් – පැටවුන් (දරුවන්), මැඩ – මර්දනය කොට (මලා තික කොට), වල – අරණ්‍යයෙහි දී, දමා – පරිත්‍යාග කොට, සඳුන් – අඹගනාව (බිසොව), පැන් වත්කොට දී – අත පැන්වත්කර පාවා දීමෙන්, වළඳ – දන් දී, වදුරු තැංගේ – වජ්‍රාසනාරූඪ විය.

1. සං:- මෙයින් දක්වුණේ වෙස්සන්තර රජුගේ පරිත්‍යාගයෝ යි. වෙස්සන්තර ජාතකය මේ පුවත හෙළි පෙහෙළි කරයි. ඉතා ලුහුඬින් වෙස්සන්තර ජාතක කථාව² මෙ සේ ය.

සටගිය දවස මහ බෝසතාණෝ වෙස්සන්තර නම් රජව උපන්හ. සියලු වස්තුව දන් දුන්හ. ඉක්බිති බිසොවුන් හා දරුවන් හා සමග වඞ්කගිරියට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදිව වුසූහ. මෙ සේ වසන සඳ මද්‍රිදේවී පලවැල සඳහා වනයට ගිය දිනෙක ජූජක බමුණා වනදුගී ගිරිදුගී ඉක්මවා වඞ්ක ගිරියට විත් දෙ දරුවන් ඉල්ලා සිටියේ ය. ඒ බමුණු මහල්ලාට ජාලිය කෘෂ්ණජිනා යන දෙව් දරුවන් බඳු දූ පුත් දෙදෙනා බුදු බව පතා දන් දුන්හ. එමතු ද නො වේ. සිය බිසොව ද එ සේ ම දන් දුන් සේක.

6. ප:- තපසිවරිනි – තාපසවරුනි, දැන් – ධ්‍යාන යෙන්, සහසා – සාහසිකව, තණ මරන්නේ – තෘෂ්ණාව විනාශ කරන්නේ ය, දෙ කෙත – දේහ (ශරීරය) නැමැති (කෙත) ක්ෂේත්‍රය, හෙළි කොට ගෙන ලා – ශුද්ධ කොට ගෙන, සෑ – චෛත්‍යයන් හා බෝ – බෝධීන්, මතු – අනාගතයෙහි, කොටන්නේ – පිහිට කොට ගන්නේ ය.

සං: 1. තපස:- පසිඳුරන් රැක ගැනීම තපස වේ. තපස් රැක ධ්‍යාන භාවනා කොට තෘෂ්ණාව නසා නිවන් යන්නේය. පිරිනිවී මෙන් පසු ආදාහනයේ දී හුණු වී ගිය (ඇට) ධාතුහු චෛත්‍යයනට සුදුසු වෙති. බුදු වීමට ඉවහල් වනුයේ බෝධිය වේ. තෘෂ්ණාව නැති කර ලීමෙන් බෝ මූලේ දී බුද්ධත්වය ලබාගත හැක.

---

2. දස ජාතක කථා – 373 පි:

“ගෘහෙපි පඤ්චෙන්ද්‍රිය නිග්‍රහඃ තපඃ –” ගෙදර දී වුවද පසිඳුරන් දමනය කරගැනුම තපස වේ. ඉන්ද්‍රිය දමනය- චිත්ත දමනය යන නමින් හඳුන්වනු ලැබේ.

2. තණ්හා:- තෘෂ්ණාව; ලොභය යනු ද මෙයට ම නමෙකි. ලොභය අකුසල මූලයෙකි. “ලොභො අකුසල මූලං” යි ඒ බව වදාළ සේක. ලොභය නම් අරමුණෙහි ඇලෙන ස්වභාවය යි. දූලි - තෙල් වස්ත්‍රයෙහි තදින් අල්ලා ගන්නාක් මෙනි. මස් වැදැලි නවුම් භාජනයෙහි තදින් ඇලෙන්නාක් මෙනි. වඳුරන් ඇල්ලීමට උගුලෙක දැමූ මකීටාලෙපයෙහි වඳුරන් ඇලෙන්නාක් මෙනි. ලොභය අකුසල් සිත් අටේ පමණක් යෙදේ. චතුරාර්‍ය්‍ය සත්‍ය දෙශනයේදී සමුදය යන නමින් වදාළේ මේ ලොභය යි.

මෙ ලොභය ත්‍රිවිධය. කාම තණ්හා - භවතණ්හා - විභව තණ්හා යන විසිනි. චක්ඛු - සොතාදී ඉඳුරන් සඳහට ගොදුරුවන (විෂයවන) රූප - ශබ්දාදියට ආශාවෙන් කැමැති වන වස්තු විෂයයෙහි පවත්නා ආශාව කාමතෘෂ්ණා නම්. මේ කාමාස්වාදය සදහට ම පවති ආදි විසින් සදාකාලික වශයෙන් සැලකීම භවතෘෂ්ණා නම්. රූපාදිය මරණින් පසු කෙලවර වන්නේ ය. උච්ඡෙද දෘෂ්ටිය සමඟ එහි ඇලීම් වශයෙන් තෘෂ්ණාව උපදනා කල විභව තණ්හා ය යි කියනු ලැබේ. මෙය සය අරමුණෙහි කාම - භව- විභව තණ්හා තුනෙන් වැඩි වූ කල අටළොස් (3 × 6 = 18) අයුරකින් තෘෂ්ණාව උපදී. තමා පිළිබඳ අටළොස ය මෙරමා පිළිබඳ අටළොස ය යි තෘෂ්ණාව ස තිස් (36) වැදෑරුම් වේ. අතීත වර්තමාන අනාගත වශයෙන් (36 × 3 = 108) අටෝර් රාශියෙකි.

බුදුන් වහන්සේ බෝ මැඩ දී පංචස්කන්ධ නැමැති ගෙය සාදන තෘෂ්ණා නැමැති වඩුවා නසන ලද්දේ ය යි “අනෙක ජාති සංසාරං..... ඈ ගයෙන් උදාන වශයෙන් වදාළ සේක.

3. ෂ:- ක බල - කාය බලය නො බිදෙන තුරු - හග්න නො වන තාක්, අද - සිතෙහි, ලුණු ලා තිබූ නම් - කරුණාව

සපගී කොට තිබුණේ නම්, ක බල - කාය බලය, බුතෝත්තිනුත් - හග්න වූව (බිඳුන) ත්, සෙට වන තුරා - ශ්‍රෙෂ්ඨ භාවයට පැමිණෙන තෙක්, ලුණු නො නසී. කරුණාව නාසනි නො වේ.

සං:- ලුණු - කරුණාව; "පරදුක්ඛෙ සති සාධූනං හදය කම්පං කරොතීති කරුණා" අනුන්ගේ දුකක් අමාරුවක් ඇති කල්හි එය දුටුවන්ගේ හදවත කම්පා කරන්නා වූ ගතිය කරුණා නම් මේ දුකින් විපතින් කවර මඟකින් හෝ ගලවා ගන්නේ දැ යි ඇති වන කාරුණික සවභාවය කරුණා නම්. "කිරති වා පර දුක්ඛං හිංසති විනාසෙති වා කරුණා" - අනුන්ගේ දුක නැති කරන හෙයින් කරුණා නම්. මෙය සත්පුරුෂයනට ම ඇති වන උතුම් ගුණයෙකි.

බුද්ධාගමයෙහි මුල් ගුණය කරුණාව වේ අග (මුදුන) ප්‍රඥාව වේ. කරුණා ශාසනය නම ද සෙදේ. අටුවා ග්‍රන්ථ රචිත අනුබුදු බුදුගොස් මා හිමියෝ බුදු රදුන් වඳින මුලට ම සඳහන් ගාථාවල බුදුන් වහන්සේගේ කරුණා ගුණයට මහත් හරසර දැක්වූහ.

"අච්ඡරා සඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු කරුණා චෙතො විමුත්තිං භාවෙති අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති සත්ථු සාසන කරො ඔවාද පති කරො අමොඝං රට්ඨ පිණ්ඩං පරිභුඤ්ජති කො පන වාදෙ යෙ තං බහුලී කරොන්තීති"

(අංගුත්තර නිකාය - 1 නිපාතය)

මහණෙනි, අසුර ගසන පමණ සුළු කාලයක් වත් කරුණා භාවනාව වඩා නම්, (චිත්තසන්තාන යෙහි නැවත නැවත උපදවා ගනී නම්) මෙ සේ වූ මහණ හිස් නුවූ ධ්‍යාන ඇතිව වෙසේ ය යි ද, බුදුන් වහන්සේගේ අවවාදනු ශාසනයට අනුකූලව පිළිවෙත් පිරීම කෙරේ ය යි ද රට වාසීන් විසින් පින් පිණිස දෙන සිවුපසය නො සිස් කොට පරිභොග කෙරේ ය යි ද කියනු ලැබේ. යම් කෙනෙක් කරුණා භාවනාව බහුල වශයෙන් පුරුදු කෙරෙත් නම් (එහි අනුසස්) කියනුම කිම?

8. ප:- දූත් - වර්තමානයෙහි, කසා නො ලදින් - කාෂාය වස්ත්‍ර නො ලද්දේ නම්, සමණත් සොයත - ශ්‍රමණ භාවය සොයන්නා වූ, දූරියන් - ධෛර්‍යවතුන් විසින්, සඳුන් - ස්ත්‍රීන් ද, සුනු - පුත්‍රයන් ද, තබා - අත්හැර, නො බා - (නිර්භයව) සසර බිය හැරලා, කසාවත්කට - කාෂාය වස්ත්‍රයට, යන්නෝ - යාම කරන්නෝය. (හෙවත් කසාවත්තට යන්නේ ශ්‍රමණ භූමියට පැමිණෙන්නෝ ය.)

සං:- කසා - කාෂාය වස්ත්‍රය - සිවුර; කොස් - නුග ආදී කසට - කහට පොවා රඳනා ලද වස්ත්‍රය කසාවත නම්. 5 - 7 කඩ ආදී වශයෙන් කපා මසා පිළියෙළ කරන ලද්දෙකි. එයට කැප සරුප් පඬු පොවා පිළියෙළ කර ගත යුතුය. රහත් දජය යන නම ද යෙදේ.

9. ප:- සැසි - ශාක්‍ය සිංහයන් (බුදුන්) වහන්සේ, රතට - අරණ්‍යයට, ඉස්සන් - සෘෂීන්, සොයා - සෙවුම් කොට, ගොස් - ගොසින්, දුලදින් - දුර්ලබ්ධීන් ද, දළ - ජටා ධරයන් ද, පිස - තුච්ඡ කොට, පනුපොවා - ප්‍රඥානුභව කරවා (ප්‍රඥාව පාතය කරවා), මග දී - මාර්ග ඥානය දීලා, කළ ළයෙන් - කාය චිත්තයෙන්, රා - රාගාදී කෙලෙශයන්, හැර පූ - අත් හැර දැමූහ.

සං:

1 සැසි:- ශාක්‍ය සිංහ.
2 ඉස්සන්:- සෘෂීන්.
3 දුලදින්:- මිසදිටු අය.
4 දළ:- ජටාධරයන්, තවුසන්.
5 මග.- සෝවාන් ආදී මාර්ග ඥානය.
6 රා:- රාගය, ඇලීම. (රාග > රා අ > රා)

බුදු - පසේ බුදු මහරහතන් වහන්සේ සෘෂි නම් වෙති. ශීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්ති ඥාන දර්ශන යන පංචවිධ ධර්මයන් පුරුදු පුහුණු කළ හෙයින් මොවුන් වහන්සේ සෘෂි නම් වෙති.

"වාචානු රක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා
එතෙ තයො කම්ම පථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං."
(ධම්මපද - මග්ග වග්ග - 9 )

යමෙක් බොරුකීම් ආදී සිවු වැදෑරුම් වාග්දුශ්චරිතය දුරු කිරීමෙන් තමා රක්තා සුලු වේ ද, අභිධ්‍යාදී මනො දුශ්චරිතය දුරු කිරීමෙන් සිතිනුදු මනා කොට රැකුණේ වේද, සතුන් මැරීම් ආදී ත්‍රිවිධ කාය දුශ්චරිතය දුරුකිරීමෙන් කාය වාරයෙන් ද අකුසල් නො කරන්නේ වේ ද, මෙ සේ ත්‍රිවිධ කර්මපථය පිරිසුදු කරන තැනැත්තා ඍෂීන් විසින් ප්‍රකාශ කරන ලද ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගයට පැමිණෙන්නේ වෙයි.

බාහිර ආගම්වල සඳහන් අයුරු ධ්‍යාන භාවනා වඩා ගත් තාපසයෝ ද ඍෂි යන නාමයෙන් හඳුන්වනු ලබති. කාලදේවල ආදීහු ය. පුරාණ කාලයේ වෛද්‍ය - නක්‍ෂත්‍ර ආදී ශාස්ත්‍ර නිපද වූ අය ද ඍෂිහු නම් වෙත් ල.

"අප මුනිඳු කලක්
රජ සිරි පැමිණ යෙහෙන්
වෙසෙමිනි'සැ නරක් දුටු
කෙණෙ හි ඉසි වෙස් ගිස් වී" - මුවදෙව්දාවත 6)

ඉසිවෙස් = තාපස වේශය. පැවිදි වීමයි.

**10.** පැ:- අරේ- ආර්‍ය තෙම, පිබිදී ගොස් - ප්‍රබෝධව ගොසින්, ඉස්සන් දසක් - ඍෂිවරයන් දසක්, දමා- දමනය කොට, රන් දී - අරණ්‍යයෙහි දී, රිදී ගෙන- සෘද්ධි උපදවා, එම ඉස්සන් - එම සෘෂිවරයන්, ඉස පිසු වේ -ඉස මුදා-ලීය.

සං: **1.** අරේ: -උතුම් අය. ආර්‍යයෝ. සෝවාන් ආදී උතුමෝ ය. කෙලෙස් සතුරන්ගෙන් දුරු වූ හෙයින් ද කෙලෙසුන් නැසූ හෙයින් ද රහසක් පව් නො කරන හෙයින් ද යන ආදී අර්‍ථයෙන් සෝවාන් ආදී උතුමෝ ආර්‍යයෝ නම් වෙති. දිනක් අරිය නම් වූ බිලී බාන්නකුට ප්‍රස්තාව වශයෙන් බුදුන් වහන්සේ මෙ සේ දෙසූ සේක.

"න තෙන අරියො හොති - යෙන පාණානි හිංසති
අහිංසා සබ්බපාණානං - අරියොති පවුච්චති,,
(ධම්මපද - ධම්මට්ඨවග්ග 15 )

සත්ත්ව හිංසා කරන තැනැත්තා ඒ හේතුවෙන් ආර්‍ය්‍ය නම් නො වේ. සියලු සතුන් කෙරෙහි කරුණා මෛත්‍රිය උපදවා ගෙන වෙසෙන තැනැත්තේ ආර්‍ය්‍ය නම් වේ ය යි කියනු ලැබේ.

2. රන්:- අරණ්‍ය= ආරඤ්ඤ> අරන් > රන් (-මූල ලොපයෙන්) වනය.

3. පිදි:- සෘද්ධිය. සිද්ධ වේනු යි - සමෘද්ධ වේනු යි සෘද්ධි නම්. (සෘද්ධි> පිද්දි> පිදි)

"නැතිව පිද්දි බලයත් ඒ මිනිස් කයා
පොළොව පළා ගෙන ගොස් වැටුණි නරකයා,,

යනු ලෝවැඩ සඟරා යි. වස්තුකාම - ක්ලේශකාමයන් හැර පියා පැවිද්දේ පටන් ධ්‍යාන - මාර්ගයන් තෙක් ඇති ලොවී - ලොවුතුරා ගුණ ලැබෙන හෙයින් සෘද්ධි නම්. මේ සෘද්ධිය දස විධ ය.

| | | |
|---|---|---|
| i | අධිට්ඨාන | ඉද්ධි |
| ii | වික්‍රුබ්බණ | ,, |
| iii | මනොමය | ,, |
| iv | ඤාණ විප්ඵාර | ,, |
| v | සමාධි විප්ඵාර | ,, |
| vi | අරිය | ,, |
| vii | කම්ම විපාකජ | ,, |
| viii | පුඤ්ඤ | ,, |
| ix | විජ්ජාමය | ,, |
| x | සම්මාපයොග | ,, |

11. ප:- නිවන් යන දූරියෝ - නිර්වාණ ප්‍රවෙශ වන්නා වූ බෝධිසත්ත්වයෝ, සමණන් දක - ශ්‍රමණයන් දැකලා, කැකිරි විස දී - කර්කශ භාවය පිස දමා, සතර පස් දා - සතරාකාර ප්‍රත්‍යයන් (සිව්පසය) දන් දී, තව - නැවත, සමණනට ම - ශ්‍රමණයන්හට ම, දිවි පුදන් - ජීවිත පූජාව කරත්.

**සං: 1. නිවන්**:- නිබ්බාණ; තෘෂ්ණාව අරමුණු නො වීම නිවන් නම්.

**2. සතර පස් ද** :- චීවර, පිණ්ඩ පාත, සෙනාසන, ගිලානප්‍රත්‍යය යන (සතර පසය) සිවු පසය.

**12**. ප:- තණ ද - තෘෂ්ණාව ඡේදනය කොට, වලට ගොස් - අරණ්‍යයට. ගොස් (වල වැද), (නැවත) අඹරා ගනුව පාදම් - පාළි ධර්මය ග්‍රහණය කරන්න, කුණු අමුඩු ගලවා- උකුණු කෙස් වැටිය ඡේදනය කර, මෝරපු- මෝහ රාගාදිය හැරදා-ලා කුසලට මුහුකරවා ගත්, දැරියෙනි - ධෛර්‍යවතුනි, නිවන් යවු- නිර්වාණ ප්‍රාප්තවනු. (රාගද්වේෂාදි කෙලෙස් බැහැර කර ලීමෙනි නිවන් දැකිය හැක්කේ.)

**13**. ප:- ඇම- සියලු, රා පිස දී-රාගාදි කෙලශයන්, විසඳා- නැති කොට, කළුසෙන් - කාය චිත්තයෙන්, ගෙන- ඇරගෙන, ඉස්සන් - ඉසිවරයන්, ඇතිලියේ ලා - අභ්‍යන්තරයෙහි දමා, නො සිඳ - නොසිඳ, වල් ගොස් - අරණ්‍යයට ගොසින්, සාවුන්- ශ්‍රාවකයන්, ගත්තෝ - ජය ගත්තෝ ය.

**සං: රා පිස දී**: (-රාගාදී කෙලශයන්)

"නත්ථි රාග සමො අග්ගි"... (ධම්මපද -සුඛවග්ග 6)

රාගය සමාන ගින්නෙක් නැති. යහපත් රූපාදිය අරමුණු කොට, සිතෙහි උපදනා ඇල්ම රාගය වේ. එය උසස් ලෙස නැගී සිටියේ නම්, රාගී පුද්ගලයාගේ සිත දවයි. ගිනි සිලක් වත් අඟුරක් වත් නොමැතිව, රාගී පුද්ගලයා දවයි. එහෙයින් රාගය සමාන ගින්නෙක් නොමැති.

කෙලෙස් නම්: සිත කෙලෙසන රාගාදිය යි. රාගාදි කෙලශයෝ කෙලෙස් මරු යන නමින් ද හඳුන්වනු ලැබෙත්. සියලු කෙලෙස් මූලසුන් කොට රහත් මඟට අරමුණු වන ශාන්ත ධර්මය කෙලශ පරිනිර්වාණ නම්.

**14**. ප:- දියත - ලෝකයෙහි, ලුණු ලා - කරුණාව පා-ලා, ඉස- ශීර්ෂයන් ද, පල්- මස් ද, ලේ- රුධිරය ද, සඳුන්- ප්‍රියාවන් ද සුතු- පුත්‍රයන් ද, හෙළ කිරි- සුදු ඇතුන් ද, මි කකාරා -මිහිකත ගුගුරුවා, දී -දන්දී-ලා, බුදු ගත්තෝ- බොධි ඥානය සමඩි ගත කළාහ, මූදවාපු- මිදීම කළෝය.

**15.** ප:- වැර සැර පිරිමියෙක්- වීර සාර පුරුෂයෙක්, තෙමේ ද- තේමිය ජාතකයෙහි දී, වල් ගොස් සිට- වනාන්තරයට ගොසින් වැදි-ලා, සතක් කැති ගෙන්වා- ක්‍ෂත්‍රියයන් සත් දෙනකු ගෙන්වා, එකැතිති- ඒකාන්තයෙන්, සත්වත්ත -සත්වසතු, ඉදි කළෙ -සෘද්ධි කෙළේ.

සං: තේමිය ද :- තේමිය ජාතකය. තේමිය ජාතකය සැකෙවින් මෙ සේ යි.

"යටගිය දවස කසී නම් රජ කෙනෙක් වුසූහ. ඔවුන්ගේ අග බිසෝ චන්‍ද්‍රාදේවියට පුතෙක් උපන. ඔහු තේමිය නම්. ගේ මහ බෝසත් තෙමේ ය. කුඩා කුමරුවා ඇකයෙහි සිටින අවස්ථාවෙක රජ තෙමේ මිනිසුනට දඬුවම් නියම කළේය. මින් පසු දිනෙක ජාතිස්මරණ ඥානයෙන් එම නුවර රජව සිට නිරයෙහි පැසුණු බව දුටු කුමාරයා ගිහිගෙයි කලකිරුණේ ය. අනතුරුව හෙ තෙම පෙර ජාතියෙක මව වූ දෙව් දුවකගේ අවවාද පරිදි කොර, බිහිරි, ගොළු වූ වකු සේ අඟවා සිටියේ ය.

මෙ සේ සොළොස් වසක් ඉකුත් වි ය. ඉන් පසු රජ තෙමේ බමුණන්ගේ කීම පරිදි එම කුමාරයා මරා වළ-ලා එන ලෙස වධකයාට අණ කළේය. මෙසින් සෝ පත් මවු බිසොව රජුගෙන් සත් දිනක් කල් ඉල්ලා ගෙන තේමිය කුමාරයාගේ රාජ්‍යය යි බෙර ලවා කුමාරයාට නො එක් අයුරින් කන්තලව් කොටත් වෙනසක් කළ නො හැකි විය. නියමිත දිනයේ දී කුමාරයා රියක තබා ගෙන යන්නේ ඔහු මරා වළලනු පිණිස ගෙන ගොස් වළ කණින අවස්ථාවෙහි කුමාරයා ඔහු හා කථා කොට තවුස් වෙස් ගෙන වන වැදුණේය. පසුව වෙනත් බොහෝ දෙන ද ඒ අනුව පැවිදි වූහ[3].

**16.** ප: ඉස්සත්-ඊර්ෂ්‍යාවත්, සොයන්තත්- හරින්නවුන් විසින්, අද ලුණු-ලා- හෘදයෙහි (සිත්හි) කරුණාව වඩා, ඉසිපතු බොන්නේ- ඊර්ෂ්‍යා ප්‍රහාණය කරන්නේය. (හෙවත්

---

3. 538 වැනි ජාතකය - දස ජාතක කථා, 1 පි:

තපොසාරය ගත්තේ ද), දඩ වැද සතුන් විද -අරණ්‍ය ප්‍රවිෂ්ටව චතුරාර්‍ය සත්‍යාවබෝධය කොට, වට හා කා -ත්‍රිවර්‍ග සම්පත් වළඳා, නිවන් යත්තේ- නිර්‍වාන ප්‍රවිෂ්ට වත්තේ ය.

සං: 1. **චතුරාර්‍ය සත්‍යය**:- දුඃඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්‍ග සත්‍යය යන මොහු වෙත්.

2. **ත්‍රිවර්‍ග සම්පත්**:- දිව්‍ය, මනුෂ්‍ය, නිවන් යනු යි.

**17**. ප: ම සමණෝ - මාගේ ශ්‍රමණයෝ (සර්‍වඥවරයෝ), දූරි ඇත්තෝ- බෛර්‍ය ඇත්තෝ ය, මම් දූරි නැත්තෙම් -මම බෛර්‍ය ශූන්‍යයෙක්මි, (එබැවින්) නැණට -ඤාණයට (හෙවත්) ප්‍රඥාපාරමිතාවට, මතු- අනාගතයෙහි, මා දූරි ඇතිවත්තේ -මාගේ බෛර්‍ය ඇති වත්තේ, තොප බෙලෙනි - තොපගේ බලයෙනි.

සං: **ප්‍රඥා පාරමිතාව**:- කරුණාවෙන් හා මෙලෝ පරලෝ වැඩ සලසන මාර්‍ගය සලසා ගැනීමෙහි දක්ෂ වූ නුවණ නම් වූ උපාය කෞසල්‍යයෙන් රක්නා ලැබූ නාම රූප ධර්‍මයන්ගේ සාමාන්‍ය ලක්ෂණ හා විශෙෂ ලක්ෂණ සතු සේ දන්නා නුවණ ප්‍රඥා පාරමිතා නම්.

තුණ්ඩිල, සත්තුභත්ත, සම්භව, සුතබ, තෙසකුණ, සරභඞ්ග, උම්මග්ග, විධුර, දෙවධර්‍ම, රාජෝවාද, ජෝතක යන ආදී ජාතක කථාවෝ ප්‍රඥාපාරමිතාව දක්වති.

**18**. ප:- දූරි ඇතිවිම් නම් - බෛර්‍ය ඇත්තේ වීනම් නැණ හා- ප්‍රඥාව හා සමඟ, එකඟයෙන් නම් - එක මාර්‍ගයක ප්‍රයාණය කෙරෙම් නම්, රා පලා - රාගාදී කෙලශච්ඡේදනය කොට, දූන් - ධ්‍යානයෙන් යුක්ත වූ, වක් ලදින් නම්- චිත්තයක් ලද්දෙම් නම්, මට සමණන් ඇයි ද? - මට ශ්‍රමණ යන්ගෙන් ප්‍රයොජන කිම් ද?

සං: දූන්:- (ධ්‍යාන=ඣාන > දූහැන් < දූන් > දූන්)

ආලම්බනොපනිද්ධ්‍යානය

ලක්ඛණොපනිද්ධ්‍යනයයි ද්විධය.

පඨවි, කසිණාදී අටතිස් අරමුණෙන් එකක් සිතට ගෙන එහිම සිත පුරුදු කොට ලැබිය යුතු අට සමවත් ආලම්බනොපනිද්ධ්‍යාන නම් අනිච්චාදී තිලකුණු මෙනෙහි කිරීමෙන් ලැබිය යුතු විදර්ශන ප්‍රඥා, මාර්ග ඵල යන මොහු ලක්ඛණොපනිද්ධ්‍යාන නම්.

19. ප:- තව එතර නො ගියෙමි - තවමත් සංසාර සාගරයෙන් එගොඩට නො පැමිණියෙමි, ම සමණෙනී - මාගේ ශ්‍රමණෙනි, මානියෙනී - පූජ්‍යවූ උත්තමයෙනි, (එහෙයින්) සතර මහ ලේ- ශාස්තෘහු උපදනා මංගලයෙහි, සරණ දී- ප්‍රතිෂ්ඨා දැයකව, මා එතර ලත්තේ - සංසාර සාගරයෙන් මා එතරට පමුණු වන්නේය.

සං:- මාණියෙනි:- (මහනිය < මහනී < මානී) අලප් විබත් බුහුබස්හි මානියෙනි යනු වේ.

20 ප:- සුබ සෙන් - ශුභාශීර්වාද ශාන්තියෙක් පැමිණියේ නම්, බව නුමුත් - භාවනාවෙන් අමුක්තව, මග නැණ - මාර්ගඥානය, දක්නා තෙක් - දර්ශනය කරන තුරු, මොර දු - මොහ රාගයෙන් පිහිතවූ, කළ - කය චින්තනය, දෙව - ධෞවනය කොට, එතර වන්නට - සංසාර සාගරයෙන් එතර වීමට, සිතමූ - චින්තනය කරම්හ

සං: 1. භාවනා:- 54 වැන්නෙහි 2 සංලක්ෂ්‍යය බලන්න.

2. මොහ:- 43 වැන්නෙහි 3 සංලක්ෂ්‍යය බලන්න.

21. ප:- කා බවා - කායගතා සති භාවනා කොට, වල් ගොස් - වන ප්‍රවිෂ්ටව, සතුන් විද - සත්‍යාවබෝධය කොට, සම්හැර ගෙන - සමථය ග්‍රහණය කොට, මගමුවා පලා - මාර්ග ඥනයට ඇතුළුව, වන පියාණන් - පද්‍ය බන්ධනය කළාවූ පිතුහු, ගොස් - ගමනය කොට, දකු - දර්ශනය කරවූ.

සං: කාබවා:- කායගතාසති භාවනාව. කය මෙනෙහි කොට කරන භාවනාවයි. "අත්ථි ඉමස්මිං කායෙ කෙසා...." ආ. වීසිති.

**22.** පඃ- දර සොයා නො යවූ – දූරාවත් ඒෂණය කොට නො යවූ, සතු සොයා - චතුස්සත්‍යයන් ඒෂණය කොට, වලට යවූ – වන ප්‍රවිෂ්ට වවූ, තම්පළා – මෝහය විදුරණය කොට, කඩවූ – ඡේදනය කරවූ, තැණ – ඤාණ වනතයෙනි, නිත්තෙන්-නිරන්තරයෙන් (අනිත්‍යා දී තිලකුණු භාවනායෙන්) පූ – පූෂ් ජාතිය, පිසවූ – තුච්ඡ කරවූ.

**1.** **චතුස්සත්‍යඃ**- 16 වැන්නෙහි සං. බලන්න.

**2.** **තම්** – තමස් ශබ්දයෙන් නිපන්නයි. '**තමස්**' නම් ලෝභ ද්වෙෂ මෝහාදි කෙලෙස් ගතියි.

සාංඛ්‍ය මතයෙහි සත්ත්වයාගේ පහළ වීමට මූල බීජවූ ගුණ තුනෙන් තුන් වැන්න යැ.

එය මහදෙවියාගෙන් නිකුත්වූ ගුණත්‍රයට '**ප්‍රකෘති**' යයිද '**මූර්තනි**' යයිද '**ප්‍රධාන**' යයිද නම් තුනෙකි. මේ මතය පිළිගතුවෝ **ප්‍රකෘති** වාදීහුයයි කියනු ලබති.

අපථ්‍ය ආහාරයට **තාමසිකාහාර** යයි ශ්‍රීමද්භගවත් ගීතාවෙහි සඳහන් වෙයි.

**"යාත යාමං ගත රසං – පූති පර්‍යුෂිතං ච යත්**
**උච්ඡිෂ්ටමපිචා මෙධ්‍යං – භොජනං තාමසප්‍රියම්"**

(– ශ්‍රීමද් භගවත් ගීතා 17-10)

=කල්ගිය පහවූ රස ඇති ආහාරය දිරාගිය = කුණුවී ගිය ආහරය – ඉඳුල් – අමෙධ්‍යය යන මේ ආහාරයෝ තාමසිකා ආහාර නම් වෙති.

**23.** පඃ- දර සොයන දූරියෙනි – දූරාවත් ඒෂණය කරන්නා වු බෛෂීවනතයෙනි, කටු දර නො අල්ලන්නේ- කර්කශ දූරාවත් ඒෂණය නො කරන්නේය. පැළි දර සොයන්නේ – ව්‍යක්ත වූ දූරාවත් ඒෂණය කරන්නේය, පැළිදර බෙලෙනි – ව්‍යක්තවූ දූරාවත්ගේ අනුබලයෙන්, පූ පිසන්නේ – පූෂ් ජාතීන් තුච්ඡ කරන්නේ යි.

**24.** පඃ- දනුමැතියෝ – ඥානවනතයෝ, වදුරු නැගෙන්නට – වජ්‍රාසනාරූඪ වන්නට, පළමු ද- ප්‍රථම ජාතීන්හි, සක්- ඇස ද, සුනු – පුත්‍රයන්ද, සඳුන්–අඟනාවන්ද,

කිරි - හස්තීන් ද, මි කකාරා - මඟි ගජිතා කරවා, පැන් දී- හස්තෝදකයෙන් පරිත්‍යාග කොට, සව්නේ දූන - සර්වඥව, මුදන් - සත්ත්වයා (සසරින්) විමුක්ත කරන්.

සං: 1. සක් - චක්‍ර ශබ්දයෙන් බිඳිණි.

2. සුනු - සුනු ශබ්දයෙනි.

3. කිරි - කරින් ශබ්දයෙන් හිත්‍යානයි.

4. සව්නේ - සර්වඥ; දතයුතු සියලු දෑ දූනගත් උතුමා ය.

25. ප:- රත් දී - අරණ්‍යයෙහි දී, පන්සිල් ගෙන - පංචශීල ග්‍රහණය කොට, දූරි ඇති - ධෛර්‍ය ඇත්තෙහි, මෝ- මෝහය ද, රා- රාගය ද, දෙසි - ද්වේෂය ද, පැන - ප්‍රඥාවෙන්, සඹා - ඡේදනය කොට, සා ගි සිතෙන් - කාය ගතා සතිඥනයෙන්, මඟපලා - මාර්ග ඵල ගනව, බව් - අවතීර්ණ වූ භාවය, දනු - දූනගන්න.

සං: 1. රාග:- 39 වැන්නෙහි 1. සං: බලන්න.

2. ද්වේෂ:- 39 වැන්නෙහි 2 සං: බලන්න.

3. මාර්ගඵල:- සෝවාන් - සෙදගාමි - අනගැමි - රහත්- මග ඵලයෝ ය.

26. ප:- තියඹ රා - තීව්‍ර වූ රාගය, මල් සමයට - ඖද්‍යානික වූ කාලයට, හැම දූරියෝ - හැම ධීරයෝ, දූ මිදු මෙන් - ජාතියෙන් මුක්ත වූවෝ වෙත්, (එසේ වූ කල්හි) සැකිරි - ක්‍ෂීණ භාවය, දළ කඩත් - දැඩිව ඡේදනය ශඛරෙන්, කුර - කෲර භාවය, සාමූලයෙන් - මූල් සහිතව (සර්වාකාරයෙන්), උපුටන් - උත්පාටනය කෙරෙත්.

27. ප:- දිවියා නො යත තුරු - කාණකවෙජාපම වූ ජීවිතය අතික්‍රාන්ත නො වන තෙක්, වල් පත - වන ප්‍රවිෂ්ට ව, ඉඳුරා ගනුව, ඉන්ද්‍රිය රක්‍ෂණය කොටගනුව, දිවි-ජීවිතය, පලා ගිය නමුත්- අතික්‍රාන්ත වී නමුත්, සම වරදි- කාමසම්පත්තියත් විරුද්ධය, බවා- භාවනා කර, තරවා - ස්ථිරකර ගනුව.

සං: කාණකච්ඡපොපමාව:- එක් ඇසක් කණ වූ කැස්බෑ පිළිබඳ උපමාව, මේ උපමාව. සර්වඥයන් වහන්සේ බාල පණ්ඩිත සූත්‍රයෙහි දී දෙශනා කළ සේක. ඒ මෙසේය: යම් පුරුෂයෙක් එක් සිදුරක් ඇති වියදණ්ඩක් මුහුදෙහි දමන්නේය. ඒ වියදණ්ඩ පෙර දිග්න් හමන සුළඟින් අපර දිගට ද, අපර දිගින් හමන සුළඟින් පෙර දිගට ද, උතුරු දිගින් හමන සුළඟින් දකුණු දිගට ද, දකුණු දිගින් හමන සුළඟින් උතුරු දිගට ද ගෙන යන්නේ ය. එම මුහුදෙහි කණ කැස්බෙක් වෙයි. ඒ කැස්බෑ සිය වසකින් හෝ දහස් වසකින් හෝ එක් වරක් හිස ඔසවන්නේය. ඒ කණ කැස්බෑගේ ග්‍රීවය සුළඟින් පෙරළෙමින් ඒ මේ අත පාවන ඒ එක් සිදුරක් ඇති වියදණ්ඩෙහි යම්කිසි කාලයකින් ප්‍රවෙශ වෙයි. මනුෂ්‍යාත්මය ලැබීම මෙ සේ දුෂ්කර බව පෙන්වීමටය මේ උපමාව දක්වා වදාළේ. "කණ කැස්බෑ විය සිදුරෙන් අහස දක්නා වගෙයි" යන අප අතර පවතින ප්‍රවාදය පහළ වූයේ මේ දේශනාව නිමිත්තෙනි.

"දිගු පුළුලින් සක්වළවන් සිඳු කුස
සියවසකින් උඩ එන කැස්බෑ හිස
විය සිදුරෙන් නැගෙතත් දුගතිය බැස
තව උපදින් නට බැරි මෙ මිනිස් කුස"

(ලෝ වැඩ සඟරා - විදගම)

28. ප:- නැණ - ඥානවන්තයෙනි, කම් - මෝගය, පළා- විදාරණය කොට, කඩවූ - ඡේදනය කරවූ, සිහටි - ස්මෘතිමත්ව කායගතාසති භාවනාව, වී - සුහුව, ගෙන - ග්‍රහණය කොට, වනවූ - ව්‍යාප්ත කරවූ, තෙල් සොයා - සෙනහය හැර, දිවවූ - ධාවනය කරවූ, කා බල බිඳලා - කාය බල භග්න කොට, නො මැ සෙවූ - පශ්චාත්තාප නො වවූ.

29. ප:- පතාලක් - ප්‍රාර්ථනාවෙන් ලත්, සැසි සමණන් - ශාක්‍ය සිංහ ශ්‍රමණයන්, ඉන් ද දී - විද්‍යමාන කල්හි, අතිස සරණැතියෙම් - අතිත්‍යාදිය ප්‍රතිෂ්ඨා කොට ඇත්තෙම්, නැණ-ඥණයට, මට පර සමණන් ඇයි ද- එසේ වූ මට බාහිර ශ්‍රමණ පාෂාණ්ඩයන් ගෙන් කම් කිම් ද?

සං: 1. අනිත්‍යාදිය:- අනිච්ච, දුක්ඛ, අනාත්ම යි.

2. බාහිර ශ්‍රමණ පාෂණ්ඩයන්:- තෘෂ්ණා ආදී මල පුඹුලා මිනිසුන් බැඳ අපායට ගෙන යන්නා වූ විපරීත අදහස් ඇති මෝඩයා "මිනිස් කෙමිනෙක්" යි බුදුන් වහන්සේ වදාළ සේක. අශෝක රජතුමා පාෂාණ්ඩයන් කෙරෙහි ද කරුණා මෛත්‍රී දක්වූ සැටි සත් වැනි ගිරි නගර ගිරි ලිපියෙහි සඳහන් වේ.

30 ප.- සමණෝ – මාගේ ශ්‍රමණයෝ, කිපෙත් නම්– කෝපි වෙත් නම් (එසේ කල්හි) තව කෙ සේ සතහම් තම්– තව කෙසේ නම් ස්නේහ කෙරෙම් ද? සමණෝ දත්තු නම්– තගේ ශ්‍රමණයෝ දෘෂ්ටිගත් පරිෂ්කාරාදීන් දත්තු නම්, කසා වත්තට – කාෂාය වස්ත්‍රයට, වැද්ද නො ම දෙති – ප්‍රවිෂ්ට විය නො දෙත්

සං: 1. සමණෝ:- පැවිද්දෝ. ශාසනිකය, බාහරිකය යි දෙ පරිදිය. ශාසනිකයෝ නම් සෝවාන්, සෙදගැමි, අනගැමි, රහත් යන උතුමෝ ය අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝයාට අයත් සෝවාන් ආදී මාර්ග – ඵලසප් පුද්ගලයෝ ය. පුහුදුන් සංඝයෝ අෂ්ටාර්‍ය පුද්ගල ගණයට ම ඇතුළත් වෙති. මේ සසුනෙහි මහඑ පැවිදි ලැබුවෝ ශ්‍රමණයෝ ය. බාහිර පැවිද්දෝ නම් තාපස- පිරිවැජ් නිගණ්ඨ ආදීහු ය. ශ්‍රමණයෝ නො කිපෙති. ශ්‍රමණ ලක්ෂණ කිපයකි. සද්ධර්ම රත්නාවලී "ඩූලි සුභද්‍රා" කතාවනිත් බලනු සෙගේ.

2. තපස:- "තපසච ධර්ම වර්තනිත්වම්" (මහා භාරතය) තපස නම් ධර්මානුකූල ජීවිතය යි.

3. කසාවතට නුසුදුස්සෝ:-

අනික්කසාවො කාසාවං- යොවත්ථං පරිද හෙස්සති
අපෙතො දම සච්චෙන -න සො කාසාව මරහති
(ධම්මපද- යමකවග්ග – 9)

කෙලෙස් කසට බැහැර නොකළා වූ යමෙක් ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන් පහවූයේ කසාවත් දරයි ද හෙ තෙම කාෂාය වස්ත්‍රයට සුදුසු නො වේ.

සං: කාණකච්ඡපොපමාව:- එක් ඇසක් කණ වූ කැස්බා පිළිබඳ උපමාව, මේ උපමාව. සර්වඥයන් වහන්සේ බාල පණ්ඩිත සූත්‍රයෙහි දී දේශනා කළ සේක. ඒ මෙසේය: යම් පුරුෂයෙක් එක් සිදුරක් ඇති වියදණ්ඩක් මුහුදෙහි දමන්නේය. ඒ වියදණ්ඩ පෙර දිගින් හමන සුළඟින් අපර දිගට ද, අපර දිගින් හමන සුළඟින් පෙර දිගට ද, උතුරු දිගින් හමන සුළඟින් දකුණු දිගට ද, දකුණු දිගින් හමන සුළඟින් උතුරු දිගට ද ගෙන යන්නේ ය. එම මුහුදෙහි කණ කැස්බෙක් වෙයි. ඒ කැස්බා සිය වසකින් හෝ දහස් වසකින් හෝ එක් වරක් හිස ඔසවන්නේය. ඒ කණ කැස්බාගේ ග්‍රීවය සුළඟින් පෙරළෙමින් ඒ මේ අත පාවන ඒ එක් සිදුරක් ඇති වියදණ්ඩෙහි යම්කිසි කාලයකින් ප්‍රවේශ වෙයි. මනුෂ්‍යාත්මය ලැබීම මෙ සේ දුෂ්කර බව පෙන්වීමටය මේ උපමාව දක්වා වදාළේ. "කණ කැස්බා විය සිදුරෙන් අහස දක්නා වගෙයි" යන අප අතර පවතින ප්‍රවාදය පහළ වූයේ මේ දේශනාව නිමිත්තෙනි.

"දිගු පුළුලින් සක්වළවත් සිදු කුස
සියවසකින් උඩ එන කැස්බා හිස
විය සිදුරෙන් නැගෙනත් දුගතිය බැස
තව උපදින් තට බැරි මෙ මිනිස් කුස"
(ලෝ වැඩ සඟරා - විදාගම)

28. ස:- නැණ - ඥානවන්තයෙනි, තම- මෝහය, පළා- විදාරණය කොට, කඩවූ - ඡේදනය කරවූ, ගිනටි - ස්මෘති මත්ව කායගතාසති භාවනාව, වී - යුහුව, ගෙන - ග්‍රහණය කොට, වනවූ - ව්‍යාපන කරවූ, තෙල් සොයා - සෙනහය හැර, දිවවූ - ධාවනය කරවූ, ක බල බිඳලා - කාය බල භග්න කොට, නො මැ සෙවූ - පශ්වාත්තාප නො වවූ.

29. ප:- පතාලන් - ප්‍රාර්ථනාවෙන් ලත්, සැසි සමණන් - ශාක්‍ය සිංහ ශ්‍රමණයන්, ඉන්ද දී - විද්‍යමාන කල්හි, අනිස සරණැතියෙම් -අනිත්‍යාදිය ප්‍රතිෂ්ඨා කොට ඇත්තෙම්, නැණ- කඳුණයට, මට පර සමණන් ඇයි ද- එසේ වූ මට බාහිර ශ්‍රමණ පාෂාණ්ඩයන් ගෙන් කම් කිම් ද?

සං: 1. අනිත්‍යාදිය:- අනිච්ච, දුක්ඛ, අනාත්ම යි.

2 බාහිර ශ්‍රමණ පාෂණ්ඩයන්:- තෘෂ්ණා ආදී මල පුඹුලා මිනිසුන් බැඳ අපායට ගෙන යන්නා වූ විපරීත අදහස් ඇති මෝඩයා "මිනිස් කෙම්නෙක්" යි බුදුන් වහන්සේ වදාළ සේක. අශෝක රජතුමා පාෂාණ්ඩයන් කෙරෙහි ද කරුණා මෛත්‍රී දක්වූ සැටි සත් වැනි ගිරි නගර ගිරි ලිපියෙහි සඳහන් වේ.

30 ප.- සමණෝ - මාගේ ශ්‍රමණයෝ, කිපෙත් නම්-කෝපි වෙත් නම් (එසේ කල්හි) තව කෙසේ සතගම් නම්-තව කෙසේ නම් ස්නේහ කෙරෙම් ද? සමණෝ දත්තු නම්-තගේ ශ්‍රමණයෝ දෘෂ්ටිගත් පරිෂ්කාරාදීන් දත්තු නම්, කසා වත්තට - කාෂාය වස්ත්‍රයට, වැද්ද නො ම දෙති - ප්‍රවිෂ්ට විය නො දෙත්.

සං: 1. සමණෝ:- පැවිද්දෝ. ශාසනිකය, බාහරිකය යි දෙ පරිදිය. ශාසනිකයෝ නම් සෝවාන්, සෙදගැමි, අනගැමි, රහත් යන උතුමෝ ය අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝයාට අයත් සෝවාන් ආදී මාර්ග - ඵලසථ පුද්ගලයෝ ය. පුහුදුන් සංඝයාත් අෂ්ටාර්‍ය පුද්ගල ගණයට ම ඇතුළත් වෙති. මේ සසුන්හි මහණ පැවිදි ලැබුවෝ ශ්‍රමණයෝ ය. බාහිර පැවිද්දෝ නම් තාපස- පිරිවැජ් නිගණ්ඨ ආදීහු ය. ශ්‍රමණයෝ නො කිපෙති. ශ්‍රමණ ලක්ෂණ කිපයකි. සද්ධර්ම රත්නාවලී "චූල සුභද්‍රා" කතාවෙනින් බලනු යෙහේ.

2 තපස:- "තපසව ධර්ම වර්තතිත්වම්" (මහා භාරතය) තපස නම් ධර්මානුකූල ජීවිතය යි.

3 කාසාවතට නුසුදුස්සෝ:-

අනික්කසාවො කාසාවං- යො වත්ථං පරිද හෙස්සති
අපෙතො දම සච්චෙන -න සො කාසාව මරහති
(ධම්මපද- යමකවග්ග - 9)

කෙලෙස් කසට බැහැර නොකළා වූ යමෙක් ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන් පහවූයේ කසාවත් දරයි ද හෙ තෙම කාෂාය වස්ත්‍රයට සුදුසු නො වේ.

**31. ප:** තපසිවරිති- තපස්චිවරිති, සීනවී, සති ප්‍රධාන භාවනාවෙන්; ව්, ශුහුම; දූන්, ධ්‍යානය; වනා ලා- ව්‍යාප්ත කොට ලා, අනීස - අනිත්‍යාදියෙන්, පූ පිස - පූර්ව ජාතීන් හැර, සතර සත්තෙන්- චතුරාර්‍ය සත්‍යයෙන්, සමහ- සවකිය මූ මාර්ග ඵලය, වළඳන්නේ - අනුභව කරන්නේ සි.

**32. ප:-** සා - සස ජාතියෙහි දී, සක- ශක්‍රයාගේ, සාබත් බලා- ක්ෂුධා කුක්ෂිය දූක, පල් පලා දෙන්නේ- මාංශ පලහා (පුළුස්සා) පරිත්‍යාග කරන්නේ, එදා- ඒ සස ජාතියෙහි, අග නැංගේ - වග්නි මස්තකාරූඪ වි ය. මෙ දා - මේ ජාති- යෙහි, මරුන් සඳා - පස් මරුන් ජය ගෙන, බුන්නේ- ක්ලෙශයන් භග්න කළේ සි.

**1. පස් මරුන්:-** i දෙවපුත්‍ර මාර, ii ක්ලෙශ මාර, iii අභිසංස්කාර මාර, iv ස්කන්ධ මාර, v මෘත්‍යු මාර යන මොහු වෙති.

i මාරයා කියන්නේ මොහුට ය. පරනිර්මිත දෙව් ලොවෙහි පෙදෙසකැ මාරකාය නම් රෞද්‍ර දෙව ගණයෙකි. ඔවුහු එතැන් සිට මහ පොළොව දක්වා පැතිර පවත්නාහ. ලෝ වැසි හැම දෙනා ම ඔවුනට අයත් ය යි සිතති. එම නිසා නිවන් අවබෝධ කරන්නවුනට විරුද්ධ ය. මේ දෙව ගණයේ ප්‍රධානයා දෙවපුත්‍ර මාර ය.

ii සිත කිලුටු කරන අශෝභන ධර්මයෝ කෙලශයෝ ය. ලෝභ, දේස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප ය යි දස දෙනෙකි. විස්තර වශයෙන් යෙළ දහසෙ (1500)කි. මේ කෙලශ මාර නම් වේ.

iii අභිසංස්කාර මාර නම් කායික, වාචසික, මානසික කර්මයෝ වෙති ලෞකික ආසා පෙරදූරිව කරනු ලබන දුශ්චරිත සුචරිත කර්ම අභිසංස්කාර මාර නම්.

iv ස්කන්ධ මාර නම් රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන ස්කන්ධයෝ ය.

v මෘත්‍යු මාර නම් පඤ්චස්කන්ධයාගේ සිඳීම නම් වූ මරණය සි.

**2. සස ජාතකය:-** බෝසත්හු සසව උපත් කල වඳුරෙක, සිවලෙක, මක්කාවෙක, යන යහළුවන් තිදෙනාට දන් දීමේ හා සිල් රැකීමේ හා අනුසස් කියාදී පෙහෙවස් රැකියහ. මගෙන් අහරක් ඉල්ලා යාචකයකු පැමිණිය හොත් මගේ ඇඟ මස් දෙමි යි සිතා සිටියහ. එකෙණෙහි සක්දෙව් රජ බමුණු වෙසින් අවුත් අහරක් ලැබෙතොත් සිල් රක්නට කැමැති බව පැවසී ය. එවිට බෝසත් සාවා ණෝ සොම්නස්ව බමුණ! ගිනි ගොඩක් ගසව, මා ගින්නට පැන මස් පිළිස්සුන විට ගෙන මාගේ මස් කා සිල් රකුව යි කීවාහ. ශක්‍රයා මවා පාන ලද ගිනි ගොඩට "මාගේ ශරීර මාංශ දානය බුදු බව ලැබීමට හේතු වේවා" යි කියමින් පැනපූහ. ඔවුන්ගේ ශීලානුභාවයෙන්, ඒ සා මහත් ගිනි ගොඩ සිහිල් විය. මේ අරුමය පුදුමය දුටු ශක්‍රයා සියලු ලෝවැස්සනට සඳ පෙනේවා යි සාවා වඩා ගෙන සඳ මඬලෙහි සස රූපය ඇඳ සාවාණන් ඔවුන් වුසූ වනයට ම යැවූහ.[4]

"සාව අප බෝසත් - සක් බමුණාට ඇඟ මස්"

(ලෝකෝපකාරය - රණස්ගල්ලේ)

**33. ප:-** දිය පිට - ජගත් මස්තකයෙහි, ඉස්සන් යන්නා දූක - සෘෂිවරයන් ප්‍රයාණය කරන්නා දූක, මිත්- ප්‍රඥුව, දනා - උපදවා, බිලි - බලිවූ, දළ දමා - ග්‍රන්ථ ධූරය හැර, සාවක ගත්තන් - ශ්‍රාවක බැවු ගත්තවුන්, මෙ දියේ - මේ ලෝක-යෙහි, දනු - අවබෝධ කර වූ. (හෙවත් තෙපි ද ඔවුන් සේ ම ශ්‍රාවක පාරමිතා පුරවු.)

**සං:-** ග්‍රන්ථධූරය නම් තෙවළා බුදුවදන් උගැන්ම ය. මෙහි ග්‍රන්ථ නම් ත්‍රිපිටක බුද්ධ ධර්මය වේ. ඒ ත්‍රිපිටක ධර්මය නම් වූ ග්‍රන්ථය ඉගෙනීම නම් වූ ධූරය - කටයුත්ත කොට ගැනීම ග්‍රන්ථ ධූරය වේ. යම් පැවිදි කෙනකු තමාගේ ශීලය ගැන සතුටුව, සිවු පිරිසුදු සීලයෙහි පිහිටා සමාධියක්-විදර්ශනාවක් වඩන්නට උත්සාහ නො කොට, ග්‍රාමාන්ත-යෙහි ම සිට තෙවළා දහම් හදාරා වදාරුවෙහි හා දෙසීම් ආදියෙහි ම යෙදේ නම් ඔහුගේ ධූරය ග්‍රන්ථ ධූරය වේ.

---

4. 317 වැනි ජාතකය - ජාතක පොත 544 පි:

**34. ප**:- කාරාවට - කතිශ භාවයට, නො ගොස් - නො පැමිණ, කණ - කණියෙහි, දුම කොස් ලූ නම්- ධර්ම සම්පත්තිය බහාලූ නම්, අඹා- වහා, මගපලා ගෙන - මාර්ග ඵල ග්‍රහණය කොට, මෝරා ගිය - මෝහ රාග නිග්‍රීත කල්හි, කියවී කියන්නෙම් -කියයුත්තෙක් කියමි. (හෙවත් පාළි ධර්මයෙන් නිසු ප්‍රතිලාභයට පැමිණියෙමි.)

**සං**: 1. මොහ:- 39 වැන්නෙහි 3 අංකය බලන්න.

2. රාග:- 39 වැන්නෙහි 1 අංකය බලන්න.

**35. ප**:- සී වැස්සෙහි - සමෘති සම්ප්‍රයුක්තව වසන්නෙනි, සරා කාලේ -බුද්ධොත්පාද කාලයෙහි, තර කය පතවූ මනුෂ්‍යාත්ම භාවය ප්‍රාර්ථනා කරවූ. (කරුණු කිම යත්?) සතර පස් සාවකගෙන - බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ, ශ්‍රාවකත්‍වය ග්‍රහණයකොට, මස් පිසන්නේ - මාත්සර්යාදී දෝෂ හරණේ, තර කයෙහි - මිනිස් බැව්හි සිට යි.

**සං**:- 1. බුද්ධොත්පාදකාලය- 36 වැන්නෙහි 2 බලන්න.

2. බුද්ධ:- "යං කිඤ්චි අත්‍ථි ඤෙය්‍යං නාම? සබ්බස්ස තස්ස බුද්ධත්තා විමොක්ඛන්තිකඤාණ වසෙන බුද්ධො" ලොවැ යම් තාක් දතයුතු දෙයක් වේ නම් ඒ හැම ඥෙයමණ්ඩලය අවබොධ කළ හෙයින් අර්හත් ඵල ප්‍රස්තාවයෙහි පහළ වූ සර්වඥතාඥානයාගේ වශයෙන් බුද්ධ නම් වන සේක. සුත බුද්ධ - චතුසච්ච බුද්ධ - පච්චෙක බුද්ධ - සම්මාසම්බුද්ධ ය යි චතුර්විධ ය

සුත බුද්ධ නම්:- බහුශ්‍රැත පුද්ගලයාය.

චතුසච්ච බුද්ධ නම්:- සියලු කෙලෙස් නසා සිවුසස් අවබොධකළ රහතන් වහන්සේ ය.

පච්චෙක බුද්ධ නම්:- අනුන්ගේ උපදෙස් නැතිව තමන්ගේ නුවණින් ම සිවුසස් අවබොධ කළේ වී නමුදු ඒ ධර්මය අනුනට දෙසා අවබොධ නො කර විය හැකි උතුමා ය. ආශය අනුශය ඥානය නැති හෙයින් පසේ බුදුවරයන්ගේ අවබොධය අසම්පූර්ණ ය.

සම්මා සම්බුද්ධ නම්:– දතයුතු සියලු දෑ මෙරමාගේ උවදෙස් රහිත ව තම නුවණින් ම අවබෝධ කළා වූ ද, තමන් දත් ධර්මය අනුන් ලවා අවබෝධ කරවීමෙහි සමත් වූ ද උතුමා ය.

**36.** ප:– තර කය පතන්නේ – මනුෂ්‍යාත්ම භාවය ප්‍රාර්ථනා කරන්නේ ය. ලුණු ලා – කුලුණු බහා, බත් පිසන්නේ – භක්ති පෝෂණය කරන්නේ ය. ඉසි පතු බොන්නේ – සෑම් ප්‍රඥාවෙන් ප්‍රයාණය කරන්නේ ය. හෙවත් සීල සංරක්ෂණාදිය කරන්නේ ය. සුවදියෙනි – සැපදායක කිරීමෙන්, සෙට – ශ්‍රේෂ්ඨව (ත්‍රෛලෝකාධිපතිව) බුදුවන්නේ – සම්‍යක් සම්බෝධි සමධිගමය කරන්නේ යි.

**1.** සං:– **සම්‍යක් සම්බෝධි සමධිගමය:–** සියලු කෙලෙස් සහිත වාසනා නැති කොට ලොවුතුරු බුද්ධරාජ්‍ය යට පැමිණෙන්නේ ය.

“කිසිවකු හටත් නැති
මූතිඳුට ස නුවණෙක් ඇති
මෙලොව හැමට ම ඇති
වාසනා ගුණ කිසිවකුත් නැති”

(ගුත්තිලය– වැත්තෑවේ)

**2** මනුෂ්‍යාත්මභාවය:– මිනිසත් බව ලැබීම දුෂ්කර ය. “දුකකිනි මිනිසත් බව ලැබ ගත්තේ” (විදුගම)

“දුල්ලභංච මනුස්සත්තං
බුද්ධුප්පාදො ච දුල්ලභො
දුල්ල භා ඛණසම්පත්ති
සද්ධම්මො පරම දුල්ලභො”

යනාදීන් මනුෂ්‍යාත්මභාවය ලැබීම ද බුද්ධෝත්පාද කාල යක ඉපදීම ද ක්ෂණසම්පත්තිය ද දුර්ලභ බවත් සද්ධර්මය ලැබීම ඊටත් වඩා දුර්ලභ බවත් දැක් වේ.

**37.** ප:– වල – අරණ්‍යයෙහි දී, අසුන් හැර – ආසනා රූඪව, දමා – ධම් චක්‍රයෙන්, විගුත් දළ බිඳ ලා – පඤ්චවර්ගීයයන් මාන භග්න කොට ලා, එ විගස ම – ඒ

ක්‍ෂණයෙහි ම, මග දී - මාගීඵල දානය කොට, අටලොස් කෙළක් පණුවත් - අෂ්ටාදශ (දහ අට) කොටියක් ප්‍රාණීන්, තැගි - සංසාර සාගරයෙන් උතාරීණී කළේ යි.

**සං:- 1. වල**·- මිගදාය. මුවනට අභය දුන් කැලය මිගදාය නම් වේ. වරණා-අසී යන ගංගා දෙක අතර පිහිටි හෙයින් වරණාසී වී ය. පසු කලෙක ය බාරාණසී නම් වූයේ. නිග්‍රොධ මිග ජාතකයේ සඳහන් අයුරු බරණැස් රජුගේ උයනෙහි නිග්‍රොධ මුව රජ්ජුරුවන් ඇතුළු සෙසු මුවන්හටත් ගොඩ දිය සතුනටත් අභය දානය එල වූ උයන මිගදාය වේ. වල කීයේ මිගදායට ය. සාරංග යනු මුවාට නමෙකි. නාථ - අධිපති - රජය යන තේරුම යි. අද ‘සාරනාත්’ ය යි මෙ පෙදෙසට වහරති.

**2. ධම්වක්‍ර ප්‍රවර්තනය**:- ධම්ම චක්කප්පවත්තනය. මෙහි “ධම්ම” ශබ්දය ඥාන පර්‍ය්‍යාය වේ. හෙද ප්‍රතිවෙධ ඥානය දේශනා ඥානය යන විසිනි. බෝමුලේ දී එක එක සත්‍යය සතර සතර අයුරෙන් සොළොස් අයුරෙක පැවැති නුවණ ප්‍රතිවෙධ ඥානයයි.

අවබොධ කොට නිම වූ සිවුසස් ඇති වූ බුදුරජුනට i සත්‍යඥාන ii කෘත්‍යඥාන, iii කෘත්‍යඥානයන්ගේ වශයෙන් ත්‍රි පරිවර්තව ද්වාදශාකාරව, පැවැත්තේ ප්‍රත්‍යවෙක්‍ෂා ඥානය යි මේ සුතුරු ආශයානුකූලව දෙශනා කරන කල්හි පැවැත්තේ දෙශනා ඥානය යි. මේ නුවණ දෙකට ම චතුස්සත්‍ය විෂයෙහි සක් යුවලක් මෙන් නො පැකිල දුවන නිසා චක්ක නම් වේ. ධම්ම චක්කය හෙවත් නැණ සක් යුවල පවත්වා ලූ සූත්‍රාන්තය වන හෙයින් ධම්ම චක්කප්පවත්තන නම් වේ.

**3. පංච වග්ගියයෝ**:- කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යනු පංච වග්ගිය (=පස් වග) මහණෝ ය. කොණ්ඩඤ්ඤ හාමුදුරුවන් ඇතුළු දෙව් බඹුන් අටලොස් (18) කෙළක් මාගී ඵල ලාභී වූහ.

ඇසළ පෝ ද කොණ්ඩඤ්ඤ හිමි සෝවාන් විය.
ඇසළ අව පැළවිය ද වප්ප හිමි සෝවාන් විය.

අව දියවක් ද හද්දිය හිමි සෝවාන් විය
අව තියවක් ද මහානාම හිමි සෝවාන් විය.
අව ජලවක ද අස්සජි හිමි සෝවාන් විය. එහි භික්ඛු උපසම්පදාව ද ලැබීය.
අව විසෙනිය ද අනනත ලක්ඛණ සූත්‍රය දෙසූ සේක.
දෙශනා කෙළවර පස්වග වහන්දෑ රහත්වූ දැය

38. ප– දමූකඩ- ධර්මය කඩ තො කොට, තමා කා සවකිය වූ සථානයෙහි අනුභව කොට, සතුරනට – ශත්‍රැනට, බත් දෙන්නේ – භක්ති දානය කරන්නේය. මහණුන් බවන්නේ – මහණදම් වඩන්නේය නතරත් වතිති– අරණ්‍ය ව්‍රත කරණයෙන්, නිවන් යන්නේ – නිර්‍වාන සුඛයට ප්‍රවිෂ්ට වන්නේ යි

සං: 1. අරඤ්ඤ:- ග්‍රාමයත් ග්‍රාමූපචාරයත් හැර ඉන් එපිට අරඤ්ඤ නම් වේ. ග්‍රාම සීමාවේ ඉඳ බිලය නමින් විශාල කුළුණක් වෙයි. එතැන සිට අජිය ධනුවෙන් (දුන්න) දුනු පන් සියයක් (500) පමණ දුර ඇති සෙනස්න අරඤ්ඤ සෙනාසනය වේ

2. අරඤ්ඤ ව්‍රත:- නම් ආරඤ්ඤිකාංගය පුරන මහණුන්ගේ හැසිරීම් ආදිය වේ ව්‍රත නම් තපස යි. එහෙත් මෙතැන භික්ෂූන්ගේ පැවිද්ද (මහණ කම) අදහස් කෙරේ.

3. අරඤ්ඤිකාංගය:– නම් ධූතාංගය සමාදන් වන්නේ මෙසේ ය.

i ගාමනත සෙනාසනං පටික්ඛිපාමි (ග්‍රාමනත සෙනසුන් අත් හරිමි. විසුද්ධි මග්ග)

ii අරඤ්ඤිකඞ්ගං සමාදියාමි. (ආරඤ්ඤකඞ්ගය සමාදන් වෙමි. – විසුද්ධි මග්ග) මේ වාක්‍ය දෙකින් එකක් කියා සමාදන් විය යුතුය මේ වත පුරන්නහු විසින් අරණ්‍යයෙහි අරුණ නැංග විය යුතු ය. ආරඤ්ඤික (වන වාසික) වත් 48 කි.

39. ප: ගුණ ගෙන – ශීලාදී ගුණයන් ග්‍රහණයකොට, ක ළයේ – කාය චිත්තයෙහි, රා - රාගය, බී පියා – සුන් කොට දමා, මසුරන් ඉස පියා – මාත්සර්ය ගුණයන්

හෙවත් මසුරු ගුණයත් දමා, තණ ද පියා - තෘෂ්ණාව ජේදනය කොට, නිවන් යත්තේ - නිර්වාන ප්‍රවේශ වන්නේ, පා පියා -පාප ක්‍ෂය කොට පියා සි සේ යි

සං: 1 රාගය. චිත්තාකර්ෂණීය රූපාදිය අරමුණුකොට සිතෙහි උපදනා ඇල්ම රාගය වේ.

2. ද්වේෂ:- සිත නො පිණවන අරමුණු නිසා සිතෙහි ඇතිවන දුෂ්ට ස්වභාවය ද්වේෂයයි. ක්‍රෝධයත් එය වේ.

3. මොහ:- නො දැනීම යි. අරමුණේ තතු මුවා කරන ගතිය යි. අවිජ්ජා යන නමින් පටිච්චසමුප්පාදයෙහි වදාළේත් මේ මොහය වේ. දෙළොස් අකුසල් සිත්හි පමණක් යෙදේ.

4. තෘෂ්ණාව:- ඇස් කන් නාසාදී සදොර උපදනා කාම තෘෂ්ණාවෝ ය. දුක්ඛ සමුදය සත්‍යයේදී "සමුදය" යන නමින් වදාළේ මේ ලෝබකම යි. 108 ක් ප්‍රභෙද ඇති.

5 මාත්සර්ය:- මච්ඡරිය - මසුරුකම - ගෙහෙඹිනි කම· තමා ගේ සම්පත්තිය හා අන්‍යයන් හා සාධාරණ බව නො ඉවසන්නේ මාත්සර්‍ය නම් වේ. ස්වකීය සම්පත් සැඟවීම ලක්‍ෂණ කොට ඇති චිත්ත ගතිය යි. මාත්සර්‍ය පුද්ගලයා තමා අයත් කිසි දැයක් අනුනට අයිතිවීම ගැන සතුටු නො වෙ යි. කාටවත් කිසිවක් නො දෙ යි. ආවසං කුලං ලාභං ධම් වණ්ණ මත්සර්‍යයයි පංච විධ ය

6. නිවන්:- නිබ්බාණ - නිර්වාණ, වාන යනු තෘෂ්ණාවට නමකි. "නි" යනු ජේදනය - වැනසීම - නැතිකිරීම යන තේරුම යි. නිබ්බාණ ( = නිවන්) යනු තෘෂ්ණාවෙන් නික්ම යාම යි. තෘෂ්ණාව අරමුණු නො වීම යි.

40. පා:- සැසී - ශාක්‍ය සිංහ වූ, දූරි - ධීර තෙම, එ ද - ඒ දිනයෙහි හෙවත් මහබිනික්මන් දවසෙහි, දිරා- ජරාවතීර්ණය, ලෙඩ - රොගාවතීර්ණය, මළ - මරණාවතීර්ණය, සමණන් - ශ්‍රමණ ය යි යන චතුර් විධ වූ පූර්ව නිමිත්ත, දක - දර්ශනය කොට, සතොස් මින් - සන්තොෂ වෙමින්, එ රාහුල ලා පියවා - ඒ රාහුල කුමාරයන් හැර, ගියේ - ප්‍රයාණය කළේ යි.

සං:- 1. මහ බිනික්මණ:- බෝසත්වරුන් අන්තිම භවයෙහි (බුදු වන ආත්මයෙහි දී) සියල්ල අත හැර ගිහිගෙන් නික්ම යෑම යි. ඒ නික්මීමට ප්‍රධාන හේතුව සිවු නිමිති දැකීම යි.

2. සිවු නිමිති:- සිද්ධාර්ථ කුමාරයා සුදු අසුන් සතර දෙනකුන් යෙදූ උතුම් රියකින් ක්‍රීඩාභිලාෂයෙන් රජවාසලින් නික්මියේ ය. ඔහුට මේ සිවුනිමිති දක්නට ලැබුණේය.

i ඇඟ රැලි වැටුණු, කුදු ගැසුණු පැසුණු හිසකේ දැලි රවුල් ඇති මහල්ලෙක්

ii අසාධ්‍ය රෝගියෙක්

iii මළකඳක්

iv මහණ රූපයක් යන මොහු වෙති. මේ සිවු නිමිති දැක මෙ සේ පිළිවිසී. මේ රූව කුමක් ද? මේ ජරා රූප යෙකි. අහෝ! මමද ජරාවට පත් වෙමි යි ආදී විසින් සිතා මහණ රූපය ගැන සිත පැහැදී ගියේ ය.

41. පඃ- සැසි කතුරු- ශාක්‍ය සිංහ කත්‍රීගුගේ, දිය රස-- සෘද්ධි රසය හෙවත් ප්‍රාතිහාර්‍ය නැමැති අමෘතය, බී-පානය කොට, තුටු මුරුංගා- මූරුන් (= දෙවියන්) සිත් සන්තොෂ කෙරෙමින්, අවල -සම්පූර්ණ ව, කෙළි කෙළි ද - ක්‍රීඩා කළ දින යෙහි, වතු අත්තෙත්- සිතින් සිත, තම් - (තම) මොහාන්ධ- කාරය, පළා- දුරුකොට; කැඩූව- ඡේදනය කළේ යි.

සං: 1. සැසි:- ශාක්‍ය සිංහ, ශාක්‍ය වංශයට ප්‍රධානයා එනම් බුදුහු.

2 ප්‍රාතිහාර්‍ය:- පෙළහර, යමා මහ පෙළහර[5] යන විසිති.

“යමා මහ පෙළ හර
දක් වන සඳෙහි මුනිවර
නික්මුණු දිය දහර
බැහැර නො කෙළෙ ද කිලුටු මොහු වෙර” යි

යමක මහා ප්‍රාතිහාර්‍යය[5] ග්‍රන්තිලයෙහි දී වැත්තෑවේ හිමියෝ වැනූහ.

5. යමක මහා ප්‍රාතිහාර්‍ය පූජා කථා – පූජාවලිය බලන්න.

**සාලිඇලේ මණ්රතන හිමියෝ**[6] මේ එක් කවකින් වැනු ප්‍රාතිහාර්ය සඳහා පැදි සියයකින් (= 101 - 102) සීමිත වූ **ප්‍රාතිහාර්ය ශතකය** සම්පාදනය කළහ.

**42.** ප:- නිවන් යන දූරියෙනි - නිර්වාණයට යාමෙහි ධෛර්ය ඇත්තෙනි, අඹු පිස - ස්ත්‍රීන් හැර දමා, දුමාලා ධ්‍යාන උපදවා - ලා, කළයේ - කාය චිත්තයෙහි, සිල් පුරා සීල සමාධ්‍යාදී ගුණ සම්පූර්ණ කොට, සතර වර - උතුම් වූ ශාස්තෘහු ගේ, බණ - ධර්මය, කරඬුවේ ලවු - කර්ණ කරණ්ඩකයෙහි (= කන් නැමැති කරඬුයෙහි) බහා ලවු.

සං: සීලය:- සිත කය දෙ දොරින් සිදු වන පව් නො කර හැරීමෙන් ඇති වන සංවර ගතිය (= හික්මීම) සීලය නම් වේ. සතුන් මැරීම, සොරකම් කිරීම, වරදවා කාමයෙහි හැසිරීම යන මින් වැළකීම ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වෙන් වීම යි. බොරු කීම, කේලාම් කීම, පරුෂ වදන් කීම, හිස් බස් තෙපලීම යන සිවු වැදෑරුම් පව් සිදුවනුයේ වාග් ද්වාරයෙනි. මේ දොරටු දෙක සංවර කර ගැනීම නම් වූ පාපයෙන් වැළකීම සීලය වේ.

මතු නම් සඳහන් වන ජාතක කථාවෝ ශීලයෙහි බලය දක්වති. ඔවුහු කුරු ධර්ම, ගඬගාමාල, ලොමහංස, සඞ්ඛපාල, භූරිදත්ත, මහා සීලව ආදී ජාතකයෝ වෙත්.

**43.** ප:- ඇදුරා:- තෘෂ්ණා නැමැති ආචාරීහු, නැගු ගෙයි - ගොඩ නැගුවා වූ ශරීර නැමැති ගෘහයෙහි, දඬුපත් කෙලශ නැමැති ගෘහෝපකරණයන්, හැම - සර්වාකාරයෙන් විදු හැර - විධ්වංසනයෙන් දුරු කොට, මඬුලු - කර්ම නැමැති ගෘහ ඝටයන්, (ප්‍රඥා නැමැති පරසුයෙන් - පොරවෙන්) සුන් බුන් කොට - ඡින්න භින්න කොට, තෙපිදු - තොපි ද, බුදුවත්තට - සම්‍යක් සම්බුද්ධ වීමට, තණ දවවු - තෘෂ්ණාව ඡේදනය කරවු.

---

6. මාතර සාහිත්‍ය වංශය (50 - 56 පි:)

සං: 1. "අනෙක ජාති සංසාරං- සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරක දිට්ඨොසි- පුන ගෙහං නකාහසි
සබ්බාතෙ ඵාසුකා භග්ගා- ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං- තණ්හානං ඛයමජ්ඣගා" ති.

ආත්ම භාවය නැමැති ගෙය කරන තෘෂ්ණාව නැමැති වඩුවා දකිමට සමර්ථ වූ බොධි ඥාන ඇස පතා මේ තාක්ම සිය දහස් ගණන් ජාති ඇති සසර එය නො ලැබ ඇවිද්දෙමි. එම්බා! වඩුව, මා විසින් තෝ දක්නා ලද්දෙහි ය. මින් මතු නුඹ මට ආත්මභාව නැමැති ගෙය නො කරන්නෙහි ය. තාගේ සෙසු කෙලෙස් නැමැති පරාල මා විසින් සිඳ බිඳ දමන ලදී. අවිද්‍යා නැමැති කැණිමඩල පලා දමන ලදී. මා සිත අරමුණු කිරීම් වශයෙන් නිවන් කරා පැමිණියේ ය. මෙ සේ මම් තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත රහත් බව ලැබීමි. බුදුන් වහන්සේගේ ප්‍රථම උදාන වාක්‍යය යි මේ.

2. බුදුවන්නට:- (සම්‍යක්) සම්බුද්ධ වීමට. පඤ්ච විධ ඥෙය්‍ය මණ්ඩලය ඇතැඹුලක් සේ දැන ගත් හෙයින් සම්මා සම්බුද්ධ ය යි කියති.

"තුන් කල්හි ම පැවැති
පද'රුත් සියල් ලොව ඇති
ඇතැ 'ඹුල සෙ දැන - ගති
එයින් "සම්මා සම්බුදුන' යෙති"

බුදු ගුණ අලංකාරය – (වීදාගම)

"බුඩ ශබ්දය සතර දෙනෙකුන් කෙරෙහි වැටේ.[7] එනම් සුතබුඩය, අනුබුඩය, පච්චේකබුඩය, සම්මාසම්බුඩය යනු වෙත්. සුතබුඩ (හෙවත් ශ්‍රැතබුඩ) නම් සකන්ධ ධාතු ආයතනාදී පරමාර්ථ ධර්මය අසා දැන ගත් තැනැත්තා වේ; අනුබුඩ යනු රහතන් වහන්සේලාට නමි. දෙවෙනි බුදුන් හෙවත් බුදුන් ලඟ බුදුහු යන විශේෂ අර්ථයෙන් බුදුන්ගේ

7. තේපාලයේ පොත්වල හැටියට ශ්‍රාවකබුඩ, ප්‍රත්‍යෙක බුඩ, මහායානිකබුඩ (සම්‍යක්සම්බුඩ) කියා කොට්ඨාස තුනක් වෙත්.

අග්‍ර ශ්‍රාවකයා ද කියනු ලැබේ; පච්චේකබුද්ධ (හෙවත් ප්‍රත්‍යේක බුද්ධ, පසේබුදු) යනු තමත් චතුරාර්‍ය සත්‍යය හෙවත් නිර්වාණ ධර්මය අවබෝධ කොට අනුන්ට අවබෝධ කරවණු නො හැකි බුදු වරයා වේ; සම්මාසම්බුද්ධ (හෙවත් සම්‍යක්සම්බුද්ධ) නම් සර්වධර්ම සර්වාකාරයෙන් අනුන්ගේ උපදෙසක් නැතුව සවකියඥාන ශක්තියෙන් සම්පූර්ණයෙන් අවබෝධ කළේ ද චතුස්සත්‍යය අනුන්ට අවබෝධ කරවන්නේ ද සම්මාසම්බුද්ධ වේ, ලොවුතුරා බුදුහු ය යි ද කියනු ලැබේ මෙ සේ බුද්ධ ශබ්දයෙන් සතර කොටසක් කියන ලද නමුත් ප්‍රධාන වශයෙන් පච්චේකබුද්ධ සම්මාසම්බුද්ධ යන දෙකොටස පමණක් ව්‍යවහාර සම්මතය......" (ඥානාදර්ශය)

**44.** ප:- නූපන්- මවු කුසින් ප්‍රසූත නුවූ, නො මියන- පිරිනිවන් නො යන, තුන් ලෝ නැති - ත්‍රෛලොකයෙහි අදෘශ්‍ය වූ, සතර ඉරියව්වෙන්- චතුර්විධ ඊර්‍යාපථයෙන්, රුසිරි දී- ලෝවැස්සනට රූපශ්‍රී දෘනය කොට, දම් දෙසුවන් - ධර්ම දෙශනා කළා වූ, බුදුන් - බුද්ධාදි ආර්‍යයන්, වඳිම්- වඳිමි. (ඔහු කවර? නිර්මිත බුදුහු ය යි සේ යි.)

සං:- 1. තුන්ලෝ- කාමලොක, රූපලොක, අරූප ලොක යන තුන යි. ස්වර්ග, මර්ත්‍ය, පාතාල යනු ද මේ යි.

2. සතර ඉරියවු- යාම්, ඊම්, ඉඳීම්, හිටීම් යනු සතර ඉරියව්වෝ වෙති.

**45.** ප:- ආදි - ප්‍රථම බොධියෙහි දී, මල- කෙලශ පරිනිර්වාන කළා වූ, සමණන් - මහා ශ්‍රමණයන් හෙවත් ගෞතම සර්වඥයන්, පසුව මළ දා - දෙ වැනිව ස්කන්ධ පරිනිර්වානය කළා වූ කාලයෙහි, ගෙන- ග්‍රහණය කොට, දවාපු- ආදාහනය කළහ. තවත් නො මළ- දෙව නුවන් නො මළහ. දැරියෝ- ධීරයෝ, තුන් වන වර පතන්- මිය යන්නන්- තෘතිය පරිනිර්වානයෙන් අනන්තර්ධාන වන්නවුන්, දර්ශනය ප්‍රාර්ථනා කෙරෙත්.

සං: 1. කෙලශ පරිනිර්වානය:- කෙලෙස් නැති කිරීමෙන් හෙවත් රහත් වීම සමඟ සියලු කෙලෙස් නැතිකිරීම කෙලශ පරිනිර්වාණය වේ. එය සොපදිසෙස නිබ්බාණ ය යි කියනු ලැබේ.

2. **ස්කන්ධ පරිනිර්වාණය**:- මෙය පිරිනිවන් පෑමයි- මරණයයි. මෙයට අනුපදිසෙස නිබ්බාණ ධාතුව ය යි කියති.

3. **ධාතු පරිනිර්වාණය**:- නම් ධාතු අන්තර්ධානය වීම යි. සැලකිලි මඳ වූ කල ඒ ඒ තැන වැඩ සිටිනා සර්වඥ ධාතූහු බුදුන් වහන්සේගේ අදිටන් බෙලෙන් සැලකිලි ලැබෙන තැනට වඩිති. කල් යත් යත් හැම තැන සැලකිලි අඩු වෙයි. එකල ලක්දිව ධාතූහු රුවන්වැලි දාගැබට වැඩමවති. එතැනින් නාග දීපයෙහි රාජායතන චෛත්‍යයට වැ මවති. එයින් මහ බෝමැඩට වැඩමවති. නාලොව, දෙව්ලොව්, බඹලොව ආදී තන්හි වූ ධාතූහු එතැනට වඩිති. සියලු ධාතූහු මහබෝමැඩ අස රැස්වූවාහු බුදු වෙස් ගෙන දෙ තිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා, අසූ අනුව්‍යඤ්ජනයෙන් හා, බ්‍යාමප්‍රභායෙන් හා පරිපූර්ණව බෝමැඩ පළක් බැඳ යමා මහ පෙළහර දක්වා සවණක් ගනරස් දහසක් සක්වළ විහිදුවාලති. එතැනට මිනිස්හු නො එළඹෙති. දසදහසක් සක්වළ දෙව් බඹහු රැස්ව අද බුදුන් වහන්සේ පිරිනිවන් පානා සේක. අද අන්තිම දැකීම වෙයි ධාතු ශරීරයෙන් ගිනි දැල් වී බඹලොව දක්වා නැඟෙයි ධාතු පිළිස්සී අවසන් වූ කල ගින්න නිවේ. මෙය ධාතු අන්තර්ධානය ය.

මෙතැන දී දෙව් බඹහු බුදුන් පුදා අනාගතයෙහි බුදු වන බුදු උතුමා දකිමු ය යි කියා නික්ම යෙති. මේ ය යි ධාතු පරිනිර්වාණය.

**46.** ප:- මී- ප්‍රඥාවෙන්, තම්- මොහාන්ධකාරය, පළා- දුරු කොට, වනපලා වන ප්‍රවිෂ්ටව, මතු- හිස ද, බලල්- පුත්‍රයන් ද, මස්- මාංස ද, මල්-- අඹුවන් ද, නවත්- නැවතත්, රත්- රුධිරය ද, දෙ නුවන් - ද්විනෙත්‍රයන් ද, දී- පරිත්‍යාග කොට, බුදු වත්තේ - සර්වඥ වත්තේ, සැබවින්- ඒකාන්ත යි.

සං:- හිස දන් දුන් තැනක් ජාතක කථාවක දුටු බවක් මතක නැත පුත්‍රයන් (දරුවන්) අඹුවන් දන විෂයෙහි පරිත්‍යාග කළ සැටි

වෙස්සන්තර [8] ජාතක කථාවෙහි දක්ක හැක. සස ජාතකය [9] මස් දන් දුන් අයුරු*ත්, චුල්ල පදුම [10] ජාතකය ලේ දන් දුන් සැටිත්, නෙත්‍රයන් දන් දුන් අයුරු සිවි ජාතකයත් [11] මැනවින් පෙන්වයි.

**47**. **ප**:- මෙ වර- මෙ සමයට මෙ- මාගේ, දෙ කුඹුරේ - දෙහ නමැති ක්ෂෙත්‍රයෙහි, කර- කර්කශ වූ, තණ- තෘෂ්ණාව, පුරා තැංගේ -සම්පූර්ණව උද්ගත විය, සිතට- අප්සීගත ස්මෘති භාවතාව, නො තැංගේ -නො ම හට ගෙන, එසින්- ඒ අඥාන කාරණයෙන්, දම- ධර්මයෙහි, ළ නො ලා- සිත් නො පිහිටුවා හෙවත් තිවත් හි සිත් නො-ලා, උන්නෙම්- සිටියෙම් හෙවත් සංසාර සාගරයෙහි රැඳුනෙමි.

---

8. 547 වැනි ජාතකය-දසජාතක කථා 373 පි:

| | |
|---|---|
| වෙසතුරුව ද | සැපත |
| යදිනට පිය'ඹ පිය | සුත |
| දන් දීමෙන් | මහත |
| ගුගුරුවා සත් යලක් | මිහිකත |

(ගුත්තිලය)

9. 317 වැනි ජාතකය- ජාතක පොත 544 පි:

| | |
|---|---|
| අප මුනි සස | කුලේ |
| දුන් දනට නොව | සසලේ |
| දෙවිඳු ඇඳි | සසලේ |
| දැනුත් පවතිය සිසි | මඬලේ |
| *පරයා පොළොව | පස් |
| දුන් යදිනට ඇඟ | මස් |
| ඔහු දනට දුන් | ගිස් |
| වීය මහ මෙර ගිරි සිරට | උස් |

(බුදුගුණ අලංකාරය)